# චූටම්මා

කෙටිකතා සංග්‍රහය

අසිත මල්ලවආරච්චි

# පටුන

පිටුව


| | | |
|---|---|---|
| 1. | ලැවරියා | 11 - 22 |
| 2. | චූටම්මා | 23 - 38 |
| 3. | දියපට්ටාව | 39 - 49 |
| 4. | දළ රළ පෙළ | 51 - 61 |
| 5. | සයුරක් සසලයි | 63 - 72 |
| 6. | මධුසමය | 73 - 87 |

# 01

## ලැවරියා

"මොකද කෙල්ලේ මෙච්චර පමා උනේ?" සීලවතී ඇතින් එන මලීගෙන් විමසුවේ කඩුල්ලට සිය දෑත තබා වෙර ගැනීමෙන්ය.

"මං එළවළු කඩේට ගියා නැන්දේ, අම්මා කිව්වා එන ගමන් එළවළු ටිකක් ගෙන්න කියලා. ඒකයි ටිකක් පමා වුනේ."

මලී සිය බෑගයෙන් මුදල් පසුම්බිය ගෙන රුපියල් 125ක් සීලවතී අත තැබුවාය. පුරුදු පරිදි එම මුදලින් සීලවතී රුපියල් 110ක් රැගෙන හැට්ටය අස්සේ ගසා ගත්තාය. ඇය ඉන් පසු මලී දෙස බැලුවේ අම්මා කෙනෙකු සිය එකම දරුවාට අවුරුද්දකට වරක් අරන් දෙන සෙල්ලම් බඩුවක් අරන් දී ඉන් තෘප්තිමත් වන දෙනෙතිනි. මලී අත ඉතිරි මුදල

දෙස නොබලා, පුරුදු පරිදි සිය මුදල් පසුම්බියට උනා ගත්තේ එම මුදල කෙතරම් පෙරැත්ත කළත් සීලවතී නැන්දාට දිය නොහැකි බව දන්නා හෙයින්ය.

" ආ ... කෙල්ලේ මේක ගෙදර ගෙනිහින් හොද්දක් හදාගෙන කාපං. මේ උෂ්ණ කාලෙට කියාපු කෑම"

සීලවතී කඩුල්ල මත එල්ලා තිබුණ සිලි බෑගය මලීට දික් කළාය.

"මොනවද නැන්දේ මේ, කතුරුමුරුංගා නේ ද? මං නැන්දාගෙන් ඉල්ලන්නමයි හිටියේ. මගේ කට පුරාම උෂ්ණ බිබිළි දාලා".

මලී එය රැගෙන අනෙක් අතේ සුළඟිල්ලේ එල්ලා ගත්තේ සීලවතී දෙස මොහොතක් බලා හිඳිමින්ය.

"මං යන්නම් නැන්දේ, අම්මා බලාගෙන ඇති ..... ඔන්න හෙට පාන්දර 04 වෙන කොට නැන්දා අපේ ගේ ළඟට එන්න. බස් එක හරියටම හතරයි කාලට අද්දනවා".

සීලවතී කිසිවක් කීවේ නැත. මලී දෙස බලා සිනාසුනා පමණි. මලී දෙවැට දිගේ කුඹුක් ලන්ද දෙසට ඇවිද යන දෙස බලා සිටියාය.

"අනේ උඹ මගේ දරුවෙක් උනානම්...."

සීලවතී තමාටම කියාගෙන සිය නිවස වෙතට පියමැන්නාය. මලීගේ නික්ම යෑමෙන් ඇගේ හිතට පාළු ගතියක් නොදැනුණා ම නොවෙයි. ඒ නිසා ඇය ගෙට ගොස් කුප්පිලාම්පුව පත්තු කරනවා වෙනුවට පිලමත හිඳගෙන බුලත් හෙප්පුව අතට ගත්තාය. හෙප්පුවේ වූ අමු පුවක් පළුව අතට ගෙන ඉතා සියුම් වෙන්නට ලීවාය. ඉන්පසු පුවක් ටික කටේ රුවාගෙන බුලත් කොළයක් ගෙන හුනු ස්වල්පයක් තවරා කටේ දමා ගත්තාය. පුවක් කැල්ලක් සපා කෑමට තරම් ඇගේ දත් ඇඳි දෙක ශක්තිමත් නැත. දත් සියල්ලෙහිම මුල දිය වී හෙල්ලෙන්නේය. ඇගේ දත් මුල් දිය වී ඇත්තේ කසිප්පුවලට යැයි ගමේ කාගෙත් මතය විය.

ගමේ විසූ හැඩකාර තරුණ කාන්තාවන් අතර රූමත් එකියක වූ සීලවතී සිය සැමියා හැර යාමෙන් පසු සිය ජීවන වෘත්තිය ලෙස තෝරා ගත්තේ කසිප්පු විකිණීමය. ගුණදාස පෙරා දෙන කසිප්පු සීලවතී විසින් පැකට් කර විකුණනු ලැබුවේ සිය නිවසේදීමය. ඇගේ එකම දරුවා වන සිරිදාසගේ අධ්‍යාපනය වෙනුවෙන් ඇය කසිප්පු විකිණීම සිය රැකියාව කර ගත්තේ රැකියා කිහිපයක්ම කිරීමෙන් අනතුරුවය.

"පුතේ ඉක්මනට නැගිටපංකෝ ..... මට පොඩ්ඩක් උදව්වෙයන් මගෙ දෙයියෝ ...."

සීලවතී තද නින්දේ වූ සිරිදාස ව මෙලෙස සතියකට දෙපාරක් අවදි කරන්නේය. ඒ ඇයගේ වෘත්තියේ එක් කොටසක් අහවර කර ගැනීමටය. ගුණදාස ගෝනියක දමා එවනු ලබන පාර්සලය රාත්‍රී දොළහ පසුවන තුරු කෙසෙල් පඳුර යට සැඟවී සිටී. දොළහ

පසුවනවාත් සමඟම සීලවතී එම පාර්සලය ගෙට ගන්නීය. ගෝනිය පැත්තකට කර ඉන් කසිප්පු දැමූ පොලිතින් බෑගයක් එළියට ගනී. එහි ගැටය ලිහීමට සීලවතීට විනාඩි 15 ක පමණ කාලයක් ගත වේ. ඉන් අනතුරුව එයට ඒ හා සමානවම වතුර ජෝගු කිහිපයක් දමා කුඩා කෝප්පයක් දමමින් කලවම් කරයි. එයට ඇඟිල්ල දමා කුප්පි ලාම්පු දැල්ලට අල්ලන සීලවතී දෙවනුව නැවත වරක් කසිප්පු බෑගයට අත දමා දිවේ ගා පදම මැන බලයි. සුපුරුදු මෙම චර්යාවෙන් අනතුරුව ඇතුළු කාමරයේ නිදාවුන් සිරිදාසව අවදි කරයි. ඒ ඇගේ සහයටය. සීලවතී කාලේ කෝප්ප දෙකක් ග්‍රොසරි බෑගයකට දමා ගැට ගසා සිරිදාස අතට දෙයි. සිරිදාස එය තවත් බෑගයකට දමා ගැටයක් ගසා පැත්තකින් ගොඩගසයි. රාත්‍රී 12 න් පසු පටන් ගන්නා මෙම කර්තව්‍යය නිම කිරීමට පැය දෙකකට අධික කාලයක් ගත වේ. ඇතැම් වේලාවකට සිරිදාස නිදි කිරා නොවැටෙනවාම නොවේ. එහෙත් සිය මවට උදව් කිරීම කෙසේ වෙතත්, මෙම හොර රහසේ ගෙන යන සෙල්ලමේ උදව්කාරයෙකු වීමට සිරිදාස කැමතිය. පැකට් කර අවසන් වූ පසු බේසමකට ඉන් කිහිපයක් දමා ගොස් කුස්සිය පැත්තේ මිදුලේ තබයි. ඉන් පසු පිහි තලයකින් පොළව හාරා මුනින් හැරවූ පොල්කට්ටක් මතු කර ගනී. එම පොල් කට්ට ඉවත් කිරීමෙන් ඇය වළලා ඇති කළයට එම කසිප්පු පැකට් බහාලයි. මෙලෙස කළගෙඩි තුනක් සීලවතීගේ මිදුලේ වළලා ඇත්තේය. පොලිසියට හසු නොවන ආකාරයට පොළොවේ සඟවා තබන කසිප්පු උදේ පාන්දර ම අවශ්‍ය ප්‍රමාණයට එළියට ගෙන වසා දමනු ලැබේ.

"අම්මේ මං නිදාගන්නද...?"

සිරිදාසව මතක් වීමෙන් සීලවතීගේ දෙනෙතට කඳුළු උනන්නට විය. ඇය පහතට නැමී චිත්තේ කොනකින් දෑස පිසදා ගෙන ඇතුල්ගෙයි දෙස එබී බැලුවාය. මුලු ගේම අඳුරුය. එහෙත් ඒ අඳුරට වඩා අඳුරක් ඇගේ හිත පුරා වෙලාගෙන ඇති බව දැනී කුස්සිය වෙත ගොස් කුප්පි ලාම්පුව පත්තු කළාය. කුප්පි ලාම්පුව ගෙන පිලෙහි වූ කනප්පුව මත තබා සීලවතී නැවත පිල මත හිඳ ගත්තාය. එහෙත් එම ආලෝකයට ඇගේ හිතේ පවතින අඳුර දුරු කිරීමට තරම් ශක්තිමත් බවක් තිබුණේ නැත.

පසෙක තිබූ බාගෙට වියපු වට්ටිය ඇය සමීපයට ගත්තේ ඉතිරි කොටස වියා දැමීමටය.

"අම්මේ මං මේ පාර පන්තියේ පළවෙනියා"

ලිපේ ඉදෙමින් තිබූ කිරිහොද්ද කුරු ගාමින් සිටි සීලවතී හැන්ද පසෙකට දමා සිය පුතා දෙස බැලුවාය.

"මගෙ රත්තරන් පුතාට තුනුරුවන්ගේ සරණයි" සීලවතී පැවසුවේ සිරිදාසව වැලඳගෙන ඔහුගේ නළල සිඹීමෙන් අනතුරුවය.

"සීලෝ මට විගහට කාලක් ගනින්කෝ"

තිගැස්සුණු සීලවතී හා සිරිදාස කුස්සියේ දොර දෙස බැලූහ. කරෝලිස් ඔවුන් දෙදෙනා දෙස බලමින් බීඩියක් උරමින් සිටියේය. ඇය සිය පුතාව අතහැර ලිබ්බොක්කේ තිබූ ලුණු මුට්ටිය උස්සා ඊට යටින් තිබුණ

මුට්ටියට අත යවා බාගේ පැකට් එකක් ගත්තාය. එහි සිය කටින් මුල්ලක් කඩා කාලේ කෝප්පය පිරෙනකල් වක්කර නැවත ගැට ගැසුවාය.

ඉතිරිය නැවත ලිබ්බොක්කේ වූ මුට්ටියට දැමීමට තැත් කරත්ම කරෝලිස්ගේ හඬට ඇය හැරී බැලුවාය.

"ඔය කාල මට දියන් ගෙනියන්න".

කියමින් කරෝලිස් මේසය මත වූ කාලේ කෝප්පය එක හුස්මට ගිල දමා කාරා එළියට ගොස් කෙළ ගැසුවේය. ඉන්පසු ලිප ළඟට විත් මුට්ටියට අත දමා ලුණු කැටයක් ගෙන කටේ දමා ගෙන සාක්කුවෙන් රු. 10ක් ගෙන සීලවතීට දිගු කළේය. සීලවතී එය රැගෙන හැට්ටය අස්සේ ගසාගෙන සිරිදාස දෙස බලා ඔහු අසලට ගොස් හිස අත ගැවාය. කරෝලිස් මේසය මත වූ ඉතිරි පැකට්ටුව ගෙන පිටව ගියේය.

"ඇයි අම්මා කසිප්පු විකුණන්නේ ..... අපේ පංතියේ ළමයි මට කියන්නේ කසිප්පු දාස කියලා අම්මේ"

සීලවතීගේ දෙනෙතට කඳුළු ඉනුවාය. ඇයට කියන්නට කිසිවක් නැත. සිය පුතාගේ හිස අත ගානවා විනා ඇයට මේ මොහොතේ වෙන කළ හැකි කිසිදු දෙයක් නැත.

පොසොන් මාසය නිමා වෙනවාත් සමඟම අධික සුළඟක් හමන්නේය. එම සුළඟට කුප්පි ලාම්පුව නිවී ගියෙන් සීලවතී ඇතුල් ගේ දෙස බැලුවාය. කළුවරේම පන් වට්ටිය පසෙක තැබූ ඇය අත ගගා කුස්සියට

පිය මැන්නාය. ගිනි පෙට්ටිය රැගෙන එයින් කුරක් ගසා එහි එළියෙන් පිල වෙත පැමිණ කුප්පි ලාම්පුව පත්තු කළාය. නැවත පිල මත හිඳගත් සීලවතී වට්ටිය වියන්නට පටන් ගත්තාය.

"මං අදින් පස්සේ කසිප්පු විකුණන්නේ නෑ මගේ රත්තරන් පුතේ..... මං කැමති නෑ තවත් උඹට ලැජ්ජ කරන්න. උඹ හොඳට ඉගෙන ගනින්. මගේ පණ කෙන්ද රැකිලා තියෙනකල් මං උඹට උගන්වනවා මගෙ පුතේ."

සීලවතී සිය සාරි පොටින් කඳුළු පිසදා ගනිමින් සිරිදාස ළඟින් මැත් උණේ මලී සමඟ කතා කිරීමට අවස්ථාව සලසාය.

"ඔයා ලොකු දොස්තර මහත්තයෙක් වෙලා ගමට එනකල් මං බලන් ඉන්නවා සිරී."

මලීට වෙන කිසිවක් කියාගත නොහැකි විය. ඇය සිය ලේන්සුවෙන් මුහුණ වසාගෙන සීලවතී පසුපස දිව ගියාය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අක්බාර් නේවාසිකාගාරයේ සිට සිරිදාස සිය විශ්වවිද්‍යාල ජීවිතයේ පළමු දිනය ගත කිරීමට සුදානම් වුයේය. තම එකම පුතාගේ මුහුණ නොදැක නින්දට නොගිය සීලවතී අද දින සිට සිය අඳුරු පැල්පතේ තනි වෙන්නීය. ඇයට දැනුණේ දරාගත නොහැකි වේදනාවකි. නමුත් සිය එකම පුතාගේ අනාගතය වෙනුවෙන් සිය දුක, පාළුව, වේදනාව අමතක කිරීමට තරම් ඇය ධෛර්යමත් ගැහැණියක් වූවාය. පේරාදෙණිය සිට නුවර ටවුටම පැමිණි ඔවුන්

දෙපළ සිය ගම බලා යන බස් රථයට නැග්ගේ හන්තාන කන්ද කොහේ තිබේදැයි විපරම් කරමින්ය. එහෙත් ඔවුන්ට හන්තාන කන්ද

කෙසේ වෙතත් විශ්වවිද්‍යාලය තියෙන ඉසව්වවත් සොයා ගැනීමට අපහසු විය. එදා පටන් සිරිදාස එනතුරු මඟ බලා සිටින සීලවතී ඉක්මනින් වියපත් වන්නට විය.

කුකුළා හැඬලීමටත් පෙර අවදි වූ සීලවතී කඩිමුඩියේ ලැවරිය කිහිපයක් තම්බා ගැනීමට සමත් විය. සිරිදාස විශ්වවිද්‍යාලයට ගිය දා පටන් ලැවරිය විකුණමින් ජීවත් වූ සීලවතීට එයට මහ ලොකු වේලාවක් ගත වුයේ නැත. ඔසරියක් ඇඟ වටා පටලවාගෙන හුළු අත්තක් පත්තු කරගෙන මලීගේ ගෙවල් දෙසට ගමන් කළේ බසය මග හැරී ඇති දැයි සැක කරමින්ය.

ඈත සිටම හුළු අත්ත දුටු මලී පාරට ආවේ බස් රථය මගහැරෙයි සිතමින්ය.

"ඉක්මනට යමු නැන්දේ. නැත්නම් අද ඇස් නෙවෙයි බලාගන්න වෙන්නෙ ..... නුවර මහ ඉස්පිරිතාලේ පුදුම සෙනඟක් නේ ඉන්නේ."

දෙදෙනාම හංදියට පැමිණ සුළු මොහොතකින් බස් රථය පැමිණියෝය. ගමෙන් වේලාවට පැමිණියත් මොවුන්ට නුවරට පැමිණෙන විට උදැසන 9.00 ට ආසන්නව තිබුණි. සීලවතීට ලැබුණේ අන්තිම අංකයයි. ඒ වනවිටත් දොස්තර මහතා ඇස් පරීක්ෂා කිරීම ආරම්භ කර තිබුණි.

රෝගීහු එකින් එක සිය ඇස් පරීක්ෂා කරගෙන පිටව ගියහ. තව ඇත්තේ කිහිප දෙනෙක් පමණි.

"පුතා මම ඩඩාගෙන් Car එකේ Key එක අරගෙන එන්නම් මෙතන ඉඳගෙන ඉන්න හරිද?"

අවුරුදු 04 ක පමණ කුඩා පිරිමි දරුවෙකු රැගෙන පැමිණි වෛද්‍යවරියක් දරුවා දොර අසල තිබූ පුටුවෙහි වාඩිකර වෛද්‍ය කුටියට ඇතුළු විය.

සීලවතීට දැඩි පිපාසයක් මෙන්ම බඩගින්නක් ද දැනෙන්නට විය. ඇය සිය පන්මල්ලෙහි වූ පාර්සලය ගෙන දිග හැර එහි තිබූ ලැවරිය දෙකෙන් එකක් මලීට දිගු කළාය.

"අනේ.....නැන්දා ලැවරියත් තැම්බුවද මේ උදේම, මමත් මාර බඩගින්නකින් හිටියේ."

කියමින් සීලවතී දිගු කළ ලැවරිය එක ගෙන මලී කෑමට පටන් ගත්තාය. සීලවතී ඉතිරි අනෙක් ලැවරිය එක කෑමට ගැනීමට සුදානම් වෙන විට දොස්තර කුටියේ දොර අසල සිටි දරුවා දැක නතරවිය. සීලවතීට සිරිදාස මතක් වූවාය. ඔහුගේ දැස් දෙක මතක් විය. ඇගේ දෙනෙතින් කඳුළු පැන්නාය. ඇය ගොස් අතේ වූ ලැවරිය එක කුඩා දරුවාට දිගු කළාය.

දරුවාද කිසිදු සැකයකින් තොරව මේ මැහැල්ල දුන් ලැවරිය එක ගෙන කන්නට පටන් ගත්තේය. සීලවතීට කියා ගත නොහැකි දාරක ස්නේහයක් ළය පුරා ඇවිලී ගියේය. ඇය දරුවාගේ හිස අත ගෑවාය.

"තමුසෙට පිස්සුද ගෑනියේ ....."

දරුවාගේ මව පැමිණ සීලවතීව තල්ලු කොට දරුවාගේ අතේ වූ ලැවරිය එක විසි කළාය. කලබලයත් සමඟම සීලවති බිම ඇදවැටුණාය. මලී දුව විත් ඇය අල්ලා ගැනිමට තැත් කළත්, එය නොහැකි විය. ඒත් සමඟම දොස්තරවරයාද කුටියෙන් එළියට පැමිණියේය.

"මොකද චාපා ....."

මේ නාකි ගෑනි කාපු ලැවරියා එක අපේ බබාට කන්න දීලා..... කොහෙන් ගෙනාපු මළ ජරාවද කියලා අපි දන්නවාද? කියමින් දරුවාගේ මව දරුවාත් රැගෙන පිටව යෑමට සුදානම් විය.

තමන් කළේ වැරැද්දක් යැයි වටහා ගත් සීලවතී සමාව ගැනීමට වෛද්‍යවරයා ගේ මුහුණ දෙස බැලුවාය. ඇයට අදහාගත නොහැක. දැසට කඳුළු ඉනුවේය. කටේ කෙළ සිඳී ගියේය. සමීපයට පැමිණ ඔහුගේ මුව අතගෑවාය.

මලීට ද අදහා ගත නොහැකිය. ඇය වෛද්‍යවරයා සමීපයට විත්

"සිරී ..... "

කියා ගත්තේ ඉතා අපහසුවෙනි. පිටව යෑමට සූදානම් වූ දරුවාගේ මව නැවත පැමිණ

"සිරි ..... තමුසෙට පිස්සුද? මේ ඉන්නේ ලකී ..... ඩොක්ටර් ලක්ෂ්මන් පුංචිහේවා. මේ මගේ හස්බන්ඩ් තේරුණාද? මෙහේ එන්න ලකී යන්න"

දරුවාගේ මව වෛද්‍යවරයා හා දරුවා යන දෙදෙනාම ඇදගෙන ගියාය. වෛද්‍යවරයාට ද අදහාගත නොහැකි සිදුවීමක් සමඟ මුව ගොළු විය. සීලවතීගේ මුහුණ පමණක් නොව මලීගේ මුහුණ බැලීමටවත් නොහැකි දුකක් ලැජ්ජාවක් ඔහුට ඇති විය. නමුත් එය සියලු දේවල් සිදුවෙද්දී සිය බිරිඳගේ පෙළඹවීමට යටත් වී ඔහු බිරිඳ සමඟ පිටව ගියේය.

සීලවතී හඬන්නට විය. මලීගේ මුව ගොළු විය. දෙදෙනා කිසිවක් කතා නොකර රෝහලේ පැයකට අධික කාලයක් සිටියෝය. අවසානයේ මලී සීලවතීගේ හිස අත ගැවාය.

"අපට වරදින්න ඇති නැන්දේ.... ඒ අපේ සිරී නෙවෙයි....."

"නෑ දුවේ උඹට උඹේ ආදරය අඳුනන්න බැරිව ඇති. ඒත් ... ඒත් අම්මා කෙනෙකුට එයාගේ දරුවා අඳුනන්න බැරි නෑ..... දුවේ."

සීලවතී එය පැවසුවේ සාරි පොටෙන් කඳුළු පිසදමමිනි.

"අදට බෙහෙත් දීලා ඉවරයි. ඉතිරි අංක හෙට. උදේ 7 ට ඇවිත් ලියාපදිංචි වෙන්න" යැයි පවසා හෙදිය නැවත වෛද්‍යවරයාගේ කුටියට ඇතුළු විය.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★

# 02

## චූටම්මා

"සීතලයි අක්කේ ....."

චූටම්මා තම ඇඟට වැටෙන මල් සහිත වතුරවලට අතින් ගසමින් කීවේ පොඩි දරුවෙකු මෙන්ය.

"මොකද? චූටම්මේ කරන්නේ .....ඔයා දැන් ඉස්සර වගේ පොඩි ළමයෙක් නෙමෙයි. හොඳට මතක තියාගන්න ඔයා දැන් ගෑනු ළමිස්සියෙක් තේරුණාද?"

පොඩි නෝනා පැවසුවේ චූටම්මා නැවූ වතුර කළය පොළවේ ගසමින්ය. තම ඇඟ දිගේ ගලා බසින වතුර බිඳු දෙස බලා හිඳි චූටම්මාගේ දෙනෙත් අවසානයේ නතර වුණේ ඇඟේ ළමැද ළඟින්ය. මල් සහිත වතුර ඇඟ දිගේ රෑරා වැටෙන විට ඇයට අනුරාගී හැඟිමක් නොදැනුණාම නොවේ. මලක් ඇගේ ළමැද වසාගෙන හිටි දිය රෙද්ද මත රැඳුණු විට එය අරගෙන නාසයට ළං කළේ පොඩි නෝනාගේ මුහුණ දෙස බලමින්ය.

"අක්කේ ..... ඇයි මේ ..... " චූටම්මා ඇසුවාය.

පොඩි නෝනා කිසිවක් පැවසුවේ නැත. චූටම්මා දෙස බලාගෙන හිටියා පමණි.

"ඇයි අක්කේ .....ඇයි මේ කඳුළු පුරවගෙන" චූටම්මා පැවසුවාය.

"නෑ..... මට අම්මා මතක් වුණා. ඔයා අපේ අම්මා වගේමයි චූටි."

පොඩි නෝනා පැවසුවේ චූටම්මා සිය ළමැදට තුරුලු කරගෙනමය.

"අද අම්මා හිටියනම් කොච්චර සතුටු වෙයිද? චූටි"

පොඩි නෝනා පැවසුවත් චූටම්මා කිසිවක් පැවසුවේ නැත. ඒ ඇය සිය මවගේ රූපය මවා ගැනීමට උත්සහ කළ හෙයිනි. එහෙත් ඇයට එය ඉතාමත් අපහසු කාර්යයක් විය. ඇයට මවගේ රූපය මවා ගැනීමට නොහැකි විය. ඇයගේ දෙනෙත ඉදිරියේ පෙනී ගියේ පොඩි නෝනාගේ රූපයයි.

'චූටම්මා' කියන වචනයක් වචනයක් ගානේ පොඩි නෝනාට සිය මව මතක් විය. ඒ ඇලිස්ගේ කටින් පිටවෙච්ච අවසන් වචනය චූටම්මා වූ හෙයින්ය. ඇලිස් මිය ගියේ චූටම්මා ඉපදුන දිනයේදීමය. ඇය චූටම්මා සිය දෑතට ගෙන පොඩි නෝනාට බාර කළේ මේ ඔයාගේ **"චූටි අම්මා"** යැයි පවසමින්ය. චූටම්මාගේ උප්පැන්නේ ලියවුණේ සිසිලින් නෝනා ලෙසය. එහෙත් අනෙක් අසල්වැසි ඥාති සියලු දෙනාම ඇයට කතා කළේ චුටි අම්මා ලෙසය. කල්යත්ම චූටි අම්මා, චූටම්මා බවට පත් විය. චූටම්මා උපදින විට පොඩිනෝනා මල්වර වියේ පසුවිය. ඇයගේ එකම බලාපොරොත්තුව වූයේ සිය නංගීව රැක ගැනීමය. අම්මා මිය ගිය පසු සිය මවගේ රැකියාව අතට ගත්තත් පොඩිනෝනා හම්බ කරන සේසතම අප්පච්චිගේ කසිප්පුවලට යට විය. එහෙත් අම්මාගේ ධෛර්ය පොඩිනෝනාට ඉහටත් උඩින් පිහිටා තිබුණු හෙයින් කඩයප්පම් හැදීමෙන් අප්පච්චිගේ කසිප්පුවලට මෙන්ම නංගිගේ තමාගේ හා ගොළු අක්කාගේ බඩකට පුරවන්නට ද ඈ සමත් වූවාය.

චූටම්මා කිසිදිනෙක පාසලකට පය තබා නැත. නමුත් හය හතර තේරෙන වයස වන විට ඈ අකුරු උගත්තාය. ඒ ඇල්බට් අයියාගෙන්ය. චූටම්මා, ඇල්බට් අයියා කියන්නට පුරුදු වුණේ පොඩි නෝනා ඇල්බට්ට අයියා කියන නිසාවෙනි. ඇල්බට් චූටම්මාට වඩා අවුරුදු 15කින් වැඩිමල්ය.

උදේ පාන්දර පොඩි නෝනා තම්බන කඩයප්පන් රැගෙන කඩපිලට යෑම චූටම්මාගේ දෛනික රාජකාරිය විය. උදේ පාන්දර අවදිවන චූටම්මා පොඩිනෝනා කඩයප්පන් තම්බන තුරු පොඩි නෝනාට උදව් කළාය. ඉන්පසු තැම්බෙන තැම්බෙන කඩයප්පම් රැගෙන කඩ වීදියට

ගියාය. ගල්කන්දෙන් බැහැගෙන කඩ විදියට යන චූටම්මාගේ දෙපා නතර වෙන්නේ පාම්බුවටවන මහ විද්‍යාලය ළඟය. ඒත් ඒ සුළු මොහොතකට පමණි. අක්කා ඉතිරි කඩයප්පම් ටික තම්බලා ඉවර ඇති කියා මතක් වෙනකොට චූටම්මා දුවගෙන ගියේ හති දමමින්ය. කඩවීදියට කඩයප්පම් ගෙන ගොස් හමාර වන චූටම්මාගේ ඊළඟ රාජකාරිය වන්නේ පොඩි නෝනාගේ දරුවන් බලා ගැනීමය. එක අතකට එය චූටම්මාට විනෝදාංශයක්ද විය. පොඩි නෝනා අවුරුද්දෙන් අවුරුද්ද දරුවන් වැදුවාය. සිය කුසෙන් නොවැදුවත් චූටම්මා ඔවුන්ව ඇති දැඩි කළේ දාරක ස්නේහයෙන්ය. සිය දරුවන් බලා ගැනීමේදීත්, ගේ දොර වැඩකටයුතුවලදීත්, පොඩිනෝනාගේ දකුණු අත වූ චූටම්මා කිසිවිටක සිය සොහොයුරියගේ හිත නොපෑරුවාය. ගොළු අක්කා බණ්ඩයියා සමඟ දීග ගිය පසු ඇගේ ගෙදරටද මාරුවෙන් මාරුවට ගොස් දරුවන් බලා ගැනීමට උදව් වූවාය.

පොඩි නෝනා සිය දරුවන්ට වඩා චූටම්මාට ආදරය කළාය. ඇය රැකබලා ගත්තේ සිය දරුවෙකු මෙන්ය. ඇඟ අළු ගසා දමා වැඩී එන චූටම්මා සිය සැමියාගෙන් බේරා ගැනීමට පොඩිනෝනාට ඉමහත් වීර්යයක් දරන්නට සිදුවිය. තේමිස් කට ගොන්නක් බීගෙන ගෙට ගොඩවන දවසට චූටම්මා රැය පහන් කළේ සිය ගොළු අක්කාගේ නිවසේය. මුලදී දවසක් හැර දවසක් ගොළු අක්කාගේ ගෙදර නැවතීමට චූටම්මා ගියත් පසුව සෑම හැන්දෑවකම ගොළු අක්කාගේ ගෙදරට යෑම පුරුද්දක් කර ගත්තාය. තේමිස් චූටම්මාට බැල්ම හෙළමින් සිටින බව දැනී ගියේ මීට අවුරුද්දකට පමණ පෙර සිටය. ඒ බව ඉව වැටුණු පොඩි නෝනා සෑම විටම තේමිස්ගෙන් චූටම්මා ඈත් කර තැබීමට

ඇල්බට්ගේ උදව් ගත්තාය. ඒ නිසාම අකුරු කියාදෙන මුවාවෙන් චූටම්මා ඇල්බට්ට සමීප කළාය.

"ඈ පොඩි නෝනෝ.... චූටම්මා හිටියට වඩා මහත්මවලා මතකද."

පොඩි නෝනාගේ අවධානය බිඳීගියේ ඇල්බට්ගේ හඬ ඇසීමෙන්ය. අලුත් මල් මල් චිත්ත ගවුමක් ඇඳගෙන කොණ්ඩ කරල් දෙකක් බැඳගෙන සිටින චූටම්මා දෙස බලා පොඩි නෝනා.

"ඇල්බට් අයියා දැන්ද ආවේ" ඇසුවාය.

"චූටම්මා ගෙට වෙච්ච වෙලාවේ නැවිත් කොහොමද පොඩි නෝනෝ"

"හිටපංකෝ මං කහට ඩිංගක් හදනකල්"

පොඩි නෝනා කුස්සියට ගියේ ඇල්බට් හා චූටම්මා දෙස මාරුවෙන් මාරුවට බලමින්ය. අද වගේ දවසක කෑම වේලක් නැදෑයින්ටවත් දීමට නොහැකි වීම ගැන පොඩි නෝනා දුක් වූවාය. ඇය කඩයප්පම් විකිණීමෙන් උපයන මුදල එදිනෙදා වියදමට පිරිමහ ගන්නෙත් බොහොම අමාරුවෙන්ය. චූටම්මාගේ කනට ඇගේ කනේ තිබුණ අරුංගල් දෙක දමා සංතෝස වූයේ තමාට හැකි පමණින් සිය යුතුකම් ඉටු කළා යැයි සිතමින්ය.

"චූටම්මාට දැන් ඉතින් නිවාඩුවක් හම්බුණානේ. අපි ආපහු අකුරු ඉගෙන ගනිමු. නේද?"

ඇල්බට් කීවේ චූටම්මා වඩාගෙන සිටි පොඩි නෝනාගේ දරුවා වඩා ගන්නා ගමන්ය.

"අක්කා කිව්වා දැන් අකුරු ඉගෙන ගත්තා ඇති කියලා" දරුවා ඇල්බට්ගේ අතට දී චූටම්මා පැවසුවාය.

"ඒ මොන කතාවක්ද?... ඈ පොඩි නෝනේ, තාම කෙල්ල අකුරු ටික අඳුන ගත්තා විතරයිනේ."

කහට කෝප්පය ගෙනෙන පොඩි නෝනා දෙස බලමින් ඇල්බට් ඇසුවේය.

"ඔය මදෑ ඇල්බට් අයියේ .... ඒකි දැන් හොඳට ලියුම් කඩදාසි කියවනවා. හෙට අනිද්දා දීග දෙන්ඩ ඉන්න එකේ මොන අකුරුද?"

පොඩි නෝනා කහට කෝප්පය ඇල්බට් අතට දිගු කර දරුවා සිය දෝතට වඩා ගත්තාය.

"අර සක්කර කෑල්ලක් ගෙනත් දියන් චූටෝ"

චූටම්මා කුස්සියට ගියේ සක්කර කැල්ලක් ගෙනෙන්නටය. ඇයට ඉස්කෝලේ මතක් විය. ඒත් ඇය කවදාවත් ඉස්කෝලේ ගියේ නැති නිසා මතක් වුණ පමාවට එය අමතක කිරීමට ඇයට හැකි විය.

"කෝ අක්කේ සක්කර බෝතලේ..." චූටම්මා ඇසුවේ කුස්සියේ සිටමය.

"ඔය දුමේ තියෙන කුඩෙද කොහෙද?"

චූටම්මා කුඩෙ ඇල්ලීමට අතදිගු කළාය. ඒත් ඒක ඇල්ලීමට තරම් ඇය උස නැත. ඇඟිලිවලින් ඉස්සුණත් උස මදිය. වටපිට බැලූ ඇය හිරමනේ තබා එය උඩට නැඟ හකුරු බෝතලේ ගත්තාය. එහි හකුරු

කෑල්ලක් තියා හකුරු කුඩුවත් ඉතිරි වී නැත. ආපහු බෝතලේ කුඩෙට දැමූ ඇය පිල වෙත පිය මැන්නාය.

"සක්කර ඉවරයි අක්කේ ....."

කියමින් චූටම්මා පොඩි නෝනාගේ අතේ හිටි දරුවා වඩාගෙන කඩුල්ල දෙසට ගියාය.

"හකුරු ඕන නෑ පොඩි නෝනෝ....."

යාන්තමට මෙන් චූටම්මාට ඇසුණි. දෙදෙනා අතර ලොකු කතාවක් යන බවත්, ඒ තමන් පිළිබඳව බවත්, දැන උන් චූටම්මා ඔවුන් මඟහැර ගියාය. ඇයට කල්පනා කරන්නට කිසිවක් නොවීය. ඇගේ ජීවිතය මෙන්ම හිතද හිස් විය.

තමන් ඒ හිස් ලෝකයේ සුළඟට වැනෙන පරඬැලක් බව තමාට අවබෝධ වී හමාරය.

ඇල්බට් කඩ වීදියේ මුදලාලි කෙනෙක්ගේ ඩ්‍රයිවර් කෙනෙක් විය. අතේ මිටේ නිතරම මුදල් ගැවසෙන හෙයින් නිතර දෙවේලේ ඇල්බට් වටේ ගල්කන්දේ මිනිස්සු කැරකුණේය. ඒ කසිප්පු බීමටය. තේමිස්ගේ ගජ යාළුවෙකු බවට ඇල්බට් පත්වූයේ මෙලෙස කසිප්පු බීමෙන් ඇති වූ සම්බන්ධයක් හේතුවෙන්ය.

මේ නිසා ඇල්බට් නිතර දෙවේලේ පොඩි නෝනාගේ නිවසට ගොඩ වූයේය. එයට තේමිස්ගෙන් බාධාවක් නොවීය. ගෙදර දොරේ අඩුම කුඩුම පිරවෙන හෙයිනුත්, තමාගේ කසිප්පු බීමට රුකුලක් වන

හෙයිනුත්, තේමිස් ඇල්බට්ට ගරු කළේය. ඒත් ඇල්බට් පොඩි නෝනාගේ ගෙදරට ගොඩවදින්නේ චූටම්මා කසාද බඳින්න යන විත්තිය තේමිස් දැන උන්නේ නැත. චූටම්මා ගෙට වෙනකල් පොඩි නෝනා බලාගෙන හිටියේ තේමස්ට හොරෙන් චූටම්මා ඇල්බට්ට දීග දීමටය. චූටම්මට යන්තම් අවුරුදු 11 පිරෙන විට ඇය ගෙට විය. සැමියාගේ ගොදුරක් වීමට පෙර චූටම්මා දීග දීමට හැකි වේවායි! පොඩිනෝනා නිතර දෙවේලේ දෙයියන්ගෙන් ඉල්ලා සිටියාය. දැන් ඊට සුදුසු කාලය උදා වී ඇත. කෙල්ල දැන් ගෙට වී ඇත. ඇල්බට් ද ඇවිත් ඇත.

"කෙල්ල ගියා කියන්නේ මගේ දකුණු අත කැඩුණා වගේ ඇල්බට් අයියේ....."

පොඩි නෝනා කීවේ ඇල්බට්ගේ අතේ තිබුණ හිස් කහට කෝප්පය අතට ගනිමින්ය.

"එහෙම කියලා ඒකිව ගෙදරට නාකි කරගන්නද හදන්නේ....."

"ඒකි ගෙදරට නාකි වෙන්නේ කොහොමද? තාම 11 ලැබුවා විතරයි. මට පුළුවන් විදියට මං කන්න දෙනවා" කියමින් පොඩිනෝනා කල්පනා කළාය.

"ඒත් මට අපේ මිනිහා විශ්වාස නෑ ඇල්බට් අයියේ, කොයි වෙලේද කියලා කියන්න බෑ....."

"ඒක තමා කෙල්ලව මට දීපන් කියන්නේ.... මට කන්න බොන්න දෙන්න බැරි කමක් නැනේ පොඩි නෝනේ....."

"ඒ උනාට ඇල්බට් අයියේ ඒකි ගෙට උනා විතරයි. තව සතියක් දෙකක් අපි ඉවසමු. මට පුළුවන් ඔය ටිකත් ඇහැ ගහගෙන ඉන්න....."

"ඔය ඇල්බට් අයියා නැගිට්ටේ යන්නද?....."

ඇල්බට් කිසිවක් පැවසුවේ නැත. පිලෙන් බැස දෙවට වෙත ගමන් කළේ චූටම්මා සමඟ කතා කිරීමේ අටියෙනි. එහෙත් ඇල්බට් තමා අසලට එන බව දැන උන් චූටම්මා ඉවත බලාගෙන සිටියාය. මොහොතක් චූටම්මා දෙස බලා සිටි ඇල්බට් වැටෙන් පැන පාරේ පල්ලම් බැස්සේය.

තමන්ට පිටුපා යන ඇල්බට් අයියා කෙරේ අනුකම්පාවක් චූටම්මා තුළ ඇති විය. එහෙත් එය ආදරයක්ද යන්න තරම් තේරුම් ගැනීමේ වයසක් චූටම්මාට නොවීය. චූටම්මාට ඇල්බට් අයියාව තමාගේ වැඩිහිටියෙක් ලෙස පෙනේ. ඇයට අවශ්‍ය තම වයසේ කෙල්ලන් සමඟ එකතු වී සෙල්ලම් බත් ඉවීමටය. පාට පාට වළලු දමා ගෙන නැටීමටය. බෝනික්කන් නැළවීමටය. නමුත් ඒ කිසිවකට චූටම්මාට අවස්ථාවක් ලැබුණේ නැත. එහෙත් ඇය සැබවින්ම පොඩිනෝනාගේ කුස්සියේ බත් ඉව්වාය. පොඩි නෝනාගේ ළමයින් නැළෙව්වාය. තව ටික දවසකින් ඇල්බට් අයියා සමඟ දීග යන්නට ද සිදු වෙයි. අක්කා කිසි දිනෙක ඇයට වැරැද්දක් නොකරන බව ඇය දැන සිටියාය. නමුත් ඒ සියල්ල පරයා ඇගේ සිත දුවන්නේ පන්සල් වත්තට ගොස් පේර කැඩීමටය. ජේන්, බේබි සමඟ සෙල්ලම් කිරීමටය.

අත දරුවා හැඬීමේ ශබ්දයෙන් චූටම්මා පියවි සිහිය ලැබුවාය. ඇය දරුවාව අනෙක් පසට වඩාගෙන නිවස කරා පිය මැන්නාය. දරුවගේ හැඬීමේ ශබ්දයට පොඩිනෝනා පිල වෙත පැමිණියාය.

"ඇයි මගේ පැටියා අඩන්නේ ..... කෝ ..... කෝ ..... එන්න අම්මා කුක්කු බොන්න....."

පොඩිනෝනා සිය දරුවා වඩාගෙන පිලමත වාඩි වී කිරි දෙන්නට වූවාය. චූටම්මා ඇගේ කකුල් දෙක උඩින් පැන ගොස් ඉස්තෝප්පුවට ගොඩවෙත්ම පිලේ බූරු ඇඳ මත වූ පාර්සලය දැක්කාය .

"මොනවද අක්කේ මේ....."

චූටම්මා පොඩිනෝනාගෙන් විමසුවේ පාර්සලය අතට ගනිමින්ය.

"ඔය ඇල්බට් අයියා ගෙනත් තියෙන්නේ ....."

පොඩි නෝනා කීවේ ගණනකට නොගෙනය.

"ඔය මොනවා කිව්වත් ඒකා උඹට මනාපයි ..... මට උඹව මේ ගෙදරින් පිට කරන්න හිත දෙන්නේ නෑ චූටෝ ඒත් ....."

චූටම්මා කිසිවක් පැවසුවේ නැත. පාර්සලය දිග හැර බැලුවාය. රතු මල්වැටුණු ගවුම් රෙද්දක් හා ඊට ගැළපෙන රිබන් පටි දෙකක් තිබුණි. චූටම්මා ගවුම් රෙද්ද නැවත බෑගයට දමා ඇඳ උඩ තබා ඉස්තෝප්පුවට ගියාය.

"මං කියන්නේ උඹට තියෙන ආදරේට නංගියේ ඌ උඹව බලාගනියි"

චූටම්මා කාමරයට පියමැන්නාය. මේසය මත ඇති ඇගේ ගල්ලෑල්ල අතට ගත්තේ ජනේලයෙන් පාර දෙස බලමිනි. ඈත පාරේ ජේන් හා බේබි පාසල් ඇරී එනු දුටුවාය. චූටම්මාට දරාගත නොහැකි වේදනාවක් ඇති විය. ගල්ලෑල්ලේ ඇල්බට් අයියා අවසන් වරට ලියූ අකුරු තාම එහිය. ඇය ගල්ලෑල්ල රැගෙන කුස්සියට ගියාය. දොර මුල්ලේ තිබුණු මොල් ගහ රැගෙන කුස්සියේ දොරින් එළි පත්තට පැමිණියාය. ගල්ලෑල්ල ගල් වංගෙඩියට දමා මෝල් ගහෙන් කෙටුවේ ඉකි ගසමිනි.

"කෝ අක්කේ චූටම්මා ....."

ඒ ජේන්ගේ හඬයි. චූටම්මා කඳුළු පිසදමා මෝල්ගහ බිත්තියට හේත්තු කළාය.

"අනේ අනේ කෙල්ලේ එළියට ආපු ගමන් කුස්සියේ වැඩ බාර ගත්තද?"

මේරි ඇසුවේ චූටම්මාගේ සුරතින්ම අල්ලාගෙනය. චූටම්මා ඔවුන් දෙදෙනා සමඟ ගෙයි පිළිකන්න පැත්තෙන් ඉස්සරහට පිය මැන්නාය. පොඩි නෝනා තවමත් අත දරුවාට කිරි දෙමින් සිටියාය.

"හිටිල්ලා කෙල්ලනේ පොඩි එකා නිදි. මම කාමරයෙන් තියලා උඹට තේ කහට ටිකක් හදනකල්....."

"ඇයි අක්කේ අද අපට තේ කහට විතරක් මදි, කැවුනුත් ඕනේ, අද කැවුම් කන්නේ නැතිව චූටම්මා කසාද බඳිද්දි කන්නද? ....."

පොඩිනෝනා, ජේන්ගේ මුහුණ දෙසද බලා අසරණ ලෙස සිනහ විය. පසුව ඇය චූටම්මා දෙසද බලා දරුවා රැගෙන ගෙට ගොඩ වූවාය.

චූටම්මා ජේන් හා බේබි සමඟ අරලිය ගහ වෙතට පිය මැන්නාය.

"ඉතින් කියපංකෝ උඹේ මනමාලයා මේ පැත්තේ ඉඳලා යනවා දැක්කා. මෙහෙද ආවේ....."

"කවුද බං....."

චූටම්මා තරහෙන් ජේන් දෙස බැලුවාය.

"කවුද ඉතින් ඇල්බට් අයියා මිසක් ....."

ජේන් කීවේ බේබි දෙස බලා ඉඟි මරමිනි.

"උඹලට පිස්සුද බං ..... මගේ හිතේ එහෙම දෙයක් නෑ"

චූටම්මා පහත අත්තක තිබූ අරලිය මලක් කඩා නාසයට ළංකරගනිමින් පැවසීය.

"අනේ නංගියෙ මේ පොඩි එකා ටිකක් වඩා ගනින්කෝ...බිම තියද්දිම ආයෙ අඬන්න ගත්තා..... බඩේ අමාරුවක් ද කොහෙද? ඇඟත් රත් කරලා ....."

හඬමින් සිටින අත දරුවා රැගෙන ආ පොඩි නෝනා චූටම්මාට කතා කළාය. චූටම්මාද දරුවා රැගෙන නළවන්නට උත්සහ කළාය. එහෙත් ඇයට දරුවා අවනත කර ගැනීමට නොහැකි විය.

"අක්කේ නරකද ඩෙරික් මහත්තයා ළඟටවත් අරං ගියොත් ....."

"කොහොමද බං යන්නේ ගෙදර කවුරුත් නැතුව ....."

"කවුරුත් මොකටද ඔය පොඩිවුන් ටික ඉන්නේ, මං ඉන්නම්."

චූටම්මා පැවසුවේ දරුවා දෙවැට දෙසට රැගෙන යමින්ය.

"අපි ඉන්නම් අක්කේ, අක්කා විගහට ගිහින් එන්න"

බේබි නෝනා කීවේ දරුවා වඩා ගනිමින්ය.

"හිටින්කෝ මං ඉක්මනට චීත්ත කැල්ලක් පටලගෙන එන්නම් ....."

පොඩි නෝනා ගෙට ගොස් චීත්තය උනා දමා අලුත් චීත්තයක් හා හැට්ටයක් ඇඳ ගත්තාය. ඇල්බට් අයියා දුන් රුපියල් 50 තවමත් බොඩිය අස්සේය. එය අතට ගත් පොඩි නෝනා මෙහොතක් කල්පනා කරන්නට විය.

"මොනවා කරන්නද කෙල්ලේ, මේ උඹ ලබා උපන් හැටි, මේක මං ගත්තේ පොඩි එකා නිසා මිසක් ....." පොඩිනෝනා තමාටම කියා ගත්තාය.

මිදුලට බැස්ස පොඩි නෝනා දරුවත් වඩාගෙන කඩිසර ගමනින් කඩුල්ල අසලට ගොස් ආපහු හැරී,

"අනේ කෙල්ලනේ උඹලා මං එනකල් හිටහල්ලා මං හනික එනවා....."
යි කීවාය.

අඬන දරුවා රැගෙන පල්ලම් බැස යන පොඩි නෝනා නොපෙනී යනතුරු බලා සිටි තිදෙනා නැවත සුපුරුදු කතා බහට වැටුණෝය.

ඉස්කෝලෙදී සිදුවන රසබර සිදුවීම් ජේන්ගෙන් හෝ බේබිගෙන් අසා දැන ගැනීමට චූටම්මා ප්‍රිය කළාය. ඇය ඒ තුළින් ඉමහත් රසයක් ලැබුවාය. කොල්ලන්ට විහිළු කරන ඒවා, ලියුම් ලියලා ඉස්කෝලේ හාමිනේගෙන් ගුටිකාපුවා, ජේන් පවසන්නේ ඉතාමත් රසවත් ආකාරයටය. එවැනි ඕපාදූප පවසමින් කාලය ගත කරන චූටම්මා ඔවුන් නැති වෙලාවලද ඒ පිළිබඳව හිත හිත සතුටු වූවාය.

"කෝ චූටෝ අක්කා තවමත් නැනේ බලන්නකෝ දැන් 5ත් පහුවෙලා ඇති ....."

ජේන් පවසුවේ බැසයන ඉර දෙස බලමින්ය.

"අම්මා බලාගෙන ඇති මොකද මෙච්චර පරක්කු කියලා"

බේබි කීවේ පොත් මිටිය තුරුලු කරගනිමිනි.

"මම කියන්නම්, ඔයාලා දැන් යන්න. මට තනියම ඉන්න පුළුවන්. පොඩිඋන් ටික දැන් එයි. උන් දැන් සෙල්ලම් කරලා එන වෙලාව....."

"අනේ අපි කොහොමද ඔයාව තනියම දාලා යන්නේ ඇරත් අද වගේ දවසක....."

"කමක් නෑ මට තනියක් නෑ ඔයාලා යන්න....."

චූටම්මා පැවසුවේ ඔවුන්ට සිනහමුසු මුහුණ පෙන්වමින්ය. කඩුල්ල දක්වා ඔවුන් සමඟ ගොස් ඔවුන් යන තුරු බලා සිට ආපසු හැරුණාය. ඉද්ද ගහේ මල් දැක මල් ටිකක් කඩා ගත් චූටම්මා ගෙට පියමැන්නේ සතියක් පමණ මල් පූජා කරන්නට බැරි වූ හෙයිනි.

පොඩි නෝනා දුවගෙන ආවේ රෑ බෝවී ඇති බව දැනී මහන්සිය නොතකාය. අත දරුවාත් වඩාගෙන එන ඇයට මහත් මහන්සියක් දැනිණි. එහෙත් ඒ කෙරේ හිත යවා විඩා නිවා ගැනීමට ඇය කාලය ගත කළේ නැත. කන්ද නැගගෙන නිවස දෙස බලාගෙන කඩුල්ල පැන්නාය.

"තවමත් මොකද මේ කෙල්ල පහන පත්තු කරලා නැත්තේ ....."

තනිවම කියවමින් පොඩි නෝනා පිල මතට පිය මැන්නාය.

පිල පුරාම මල් විසිරී ඇති දුටු සැනින් පොඩි නෝනා අන්දමන්ද විය. ඇය නිදි දරුවා පිල මත වූ බූරු ඇඳමත තබා බිම විසිරී ඇති මල් දෙස බලා ඉස්තෝප්පුවට ගොඩවිය.

ඉස්තෝප්පුවේ බුදු ලෑල්ලට පහළ බලා සිටි පොඩි නෝනාට ක්ලාන්ත ගතියක් දැනෙන්නට විය. ඇය එලෙසම බිම ඇද වැටුණාය.

සිහිය එන විට ඇය දුටුවේ වෙරි මර ගාතේ කුස්සියේ දොර අයිනේ හිඳගෙන සිටින තේමිස්ය.

නමුත් පොඩි නෝනා ඔහු දෙස බැලුවේ කළකිරීමෙන්ය. දෑසට කදුළු ඉනුවේ නැත. කටට කෙළ ආවේ නැත. හඬ පිට වුයේ නැත. නමුත් දරා ගත නොහැකි වේදනාවක් පපුව තුළින් නැගී මුළු සිරුර පුරාම දිව ගියේය.

ඉස්තෝප්පුවෙන් පිලට ආ පොඩි නෝනා බූරු ඇඳ මත වූ පාර්සලයෙන් අලුත් ගවුම් රෙද්ද එළියට ගෙන ඉස්තෝප්පුවේ වැටී සිටි චූටම්මාගේ නිරුවත් සිරුර වසා දැම්මාය.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★

# 03

## දිය පට්ටාව

"අපි පැනලා යමු"

මුහුදු සුළඟට විසිරෙන චංචලාගේ කෙහෙරැල් එක්තැන් කිරීමේ නිරර්ථක උත්සහයක යෙදෙමින් සදෙව් චංචලාට කීවේය.

"පිස්සුද සදෙව් අපි පැනල ගිහින් කොහොමද ජීවත් වෙන්නේ "

චංචලා කීවේ ඈත ක්ෂිතිජය දෙස බලාගෙන ඉතා සැහැල්ලුවෙන්ය. චංචලාගේ මුවින් පිට වූ වචනවලින් සදෙව්ට තේරුම් ගියේ තමන්ගේ මුවින් පිට වූ ප්‍රකාශයේ බරපතළ බවට වඩා චංචලාගේ ප්‍රතිචාරය ඉතාමත් සරල ආකාරයක් ගත් බවයි.

" නෑ.... මම විහිළුවට ඇහුවේ ඔයා මොනවා කියයිද කියලා බලන්ඩ"

" ඔය වගේ කතා විහිළුවට ගන්න එපා සදෙව්. අනික "

කියමින් චංචලා කියන්න ගිය දේ ගිලගෙන සදෙව්ගේ මුහුණ දෙස බැලුවාය.

"ඇයි... අනික කියලා කතාව නතර කළේ ?"

සදෙව් ඇයගේ ප්‍රශ්නකාරී මුහුණ දෙස බලාගෙනම විමසුවේය.

"වෙලාවකට හිතෙනවා අපි මිරිඟුවක් පිටුපස්සේ දුවනවා කියලා. මට ඔයත් එක්ක ජීවත්වෙන එක ගැටලුවක් නෙමෙයි. ඔයා මට ආදරෙයි කියලා හොඳටම දන්නවා. ඒත්..."

"නෑ චංචලා මට ඔයාව බලාගන්න බෑ. ඒක තමා ඇත්ත. මං කොච්චර ආදරේ කළත්, ඔයාගේ තාත්තා ඔයාට ආදරේ කරන තරමට මම ඔයාට ආදරය නැතිව ඇති. ඔයාගෙ තාත්තා ඔයාට දීලා තියෙන සැප සම්පත්වලට කිට්ටු වෙන්නවත් මට බැරි වෙයි. හරියට අහසට පොළව වගේ. එහෙම තැනක ඉඳගෙන මම ඔයාට පැනලා යන්ඩ යෝජනා කරන එක හරිම වැරදියි. ඒක නේද ඇත්ත.."

සදෙව් චංචලාගේ දෑස දෙස බලාගෙනම කතා කළේය.

"චංචලා .... "

ගැඹුරු කටහඬක් පිටුපසින් ඇසෙත්ම දෙදෙනාම කලබල වී එකවරම පිටුපස බැලූහ.

"තාත්ති.."

චංචලා ගැහෙමින් නැගිට්ටාය. ඇය මාරුවෙන් මාරුවට සිය පියා දෙසත් සදෙව් දෙසත් බැලුවාය.

හවස් වරුවේ පැවති දේශනවලට සහභාගි නොවී ගල්කිස්ස මුහුදු තීරයේ ගල් පඩියක් මතට වී තම පෙම්වතා සමඟ පෙම්බස් දොඩමින් සිටි ගුණතිලක මහතාගේ එකම දියණිය අද ඔහුගේ අතටම හසු වී ඇත. චංචලාට වචන අමතක වී ඇත. සදෙව් ගොළු වී ඇත. ගුණතිලක මහතාද කිසිවක් ප්‍රකාශ කළේ නැත. මොහොතක් ඔවුන් දෙපළ දෙස බලා සිට ආපසු හැරුණි. ගාලු පාර අසල පොල් ගසක් යට නවතා තිබූ සිය කාර් රථය දෙසට පියමන් කළේය.

චංචලා සදෙව්ට කිසිවක් කිවේ නැත. උන් තැනින් දෙදෙනාම නැගිට ඇත. චංචලා සදෙව්ගේ මුහුණ දෙස එක්වරක් පමණක් බලා තමන්ට පිටුපා යන සිය පියාගේ පිටුපසින් ගැහෙන හදවතින් යුක්තව ගමන් කළාය. ගුණතිලක මහතා වාහනයට ගොඩ විය. චංචලා ද රථය පිටුපසට නැගුණි. නමුත් වාහනය පණ ගැන්වූයේ නැත. ගුණතිලක මහතා බර කල්පනාවකය. ඒ කල්පනාවේ ගැඹුර සෙවීමට චංචලාට ශක්තියක් නැත. ඇය පිටුපස වීදුරුවෙන් සදෙව් දෙස බැලුවාය. ඔහු උන් තැනම හිටගෙන බලාගෙන සිටී.

" අර ළමයට එන්න කියන්න"

ඒ ගුණතිලක මහතාගේ හඬයි. චංචලා කාරයෙන් බැස සදෙව් අසලට ගියාය.

" තාත්ති අඬගහනවා ... මට බයයි සදෙව් "

සදෙව් කිසිවක් ප්‍රකාශ කළේ නැත. දෙදෙනාම වාහනය අසලට ගියෝය.

" නඟින්න "

ගුණතිලක මහතාගේ විධානය ලැබුණි. වෙව්ලන දැතින්ම ඔහු පිටුපස දොර හැර එයට ගොඩවූයේය. රථය පණ ගැන්විණ. ගාලු පාර දිගේ කොළඹ දෙසට ගමන් කරන රථය විශාල මන්දිර, හෝටල් පසු කරමින් ඉදිරියට ඇදුණි. තිදෙනාගේ හුස්ම වැටෙන හඬ හැරෙන්නට කිසිදු හඬක් ඒ තුළින් නැගුණේ නැත. තමන් ගත කරන ලද දිර්ඝතම පැය මේ දැන් පසු කරමින් සිටින බව චංචලාට මෙන්ම සදෙව්ට ද දැනිණ. අවසානයේ සුවිශාල මන්දිරයක දොරටු විවෘත විය. සුදු වැලි තලා මැදින් තෙමහල් නිවසක් කරා රථය ගමන් ගත්තේය. එය ඉදිරිපිට වාහනය නතර විය.

ගුණතිලක මහතා වාහනයෙන් බැස නිවසේ දොර දෙසට ගමන් කර නැවත හැරී පැමිණ දෙදෙනා දෙස බැලුවේය.

"බහින්ඩ"

දෙදෙනාම බැස ගෙට ඇතුළු වූහ. චංචලාට තමන්ගේ නිවසේ වෙනදා නැති පාළු මූසල ගතියක් දැනිණ. සිය පියා මේ වන විට තරප්පු පෙළ දිගේ දෙවන මහලට නගිමින් සිටියේය. ඇය සදෙව්ට අසුනක් පෙන්වා

"වාඩිවෙන්න"

යැයි පවසා ඇය සිය කාමරය වෙත ගමන් කළාය. මේ සුවිශාල මන්දිරයේ තමා විතරක් තනි වී ඇති හැඟීමක් සදෙව්ට දැනුණි. චංචලා ද නැත. ඇයගේ පියාද නැත. තමා පමණක් තනි ව ඇත.

ගුණතිලක මහතා සැහැල්ලු ඇඳුමකින් සැරසී සදෙව් හිඳගෙන සිටි පුටු සැටියේ එක් අසුනකට බර විය. සදෙව්ගේ හද ගැස්ම එන්න එන්නම වැඩි විය. ඔහු බිය වූයේ එම හඬ ගුණතිලක මහතාට ද ඇසේවියැයි සිතමින්ය.

" ඔය ළමයගේ නම"

"සදෙව් විශ්වනාත් "

"වාසගම "

"හේරත් මුදියන්සේලාගේ "

"ගම "

"පොල්පිතිගම "

"කුරුණෑගල පැත්තේ "

"කුරුණෑගල ඉඳලා කිලෝ මීටර් 40ක් විතර තියෙනවා"

"අම්මා - තාත්තා "

"අම්මා නැතිවුණේ මම 5 වසර ඉන්නකොට. තාත්තා ඉන්නවා"

"රස්සාව"

"මම තාම ඉගෙනගන්නවා, කලා පීඨයේ"

"මම ඇහුවේ තාත්තාගෙ රස්සාව"

"ගමේ ගල් වලේ ගල් කඩනවා"

"තාත්තට උදව් කරනවද?"

"තාත්තා කියනවා පුතා හොඳට ඉගෙනගන්න, ගෙදර වැඩ එයා බලා ගන්නම් කියලා"

"චංචලා හමුවුණේ කැම්පස් එකේදිද?"

"ඔව්"

"චංචලාට කැමතිද?"

"ඔව්"

"මම ඔය ළමයට අවස්ථාවක් දෙනවා හැබැයි පැය 24ක් විතරයි. ඒ දවස තුළ ඔය ළමයා කාරණා 2 ක් කරන්ඩ ඕන".

"එක ඔය ළමයා තව අවුරුදු 05ක් ඇතුළත තමන් යන්න හදන ස්ථාවරය පිළිබඳ අනාගත planඑක මට කියන්න ඕන".

"දෙක".

"දෙක තමයි, තමන්ගේ තාත්තගේ රැකියාව පිළිබඳ සම්පූර්ණ විස්තරයක් හොයාගෙන එන්ඩ ඕන".

"හරිම ලේසියි පැය 24ත් හොඳටම වැඩියි. හෙට මේ වෙලාවට මේ ගෙදරට එන්න පුළුවන්. දැන් යන්න."

ගුණතිලක මහතාගේ විධානයෙන් පසුව සදෙව් චංචලාගේ නිවසින් පිට වී සිය නේවාසිකාගාරයට පැමිණියේය. කඩිමුඩියේ හැඳ පැලඳගෙත් ඔහු සිය නිවෙස බලා ගමන් ගත්තේය. ඔහු නිවෙසට ළඟා වන විට රාත්‍රී 9.00ට ආසන්න වී තිබුණි. තමන්ට රාජකාරි 2ක් ඇත. එයින් ඉතා සරලම රාජකාරිය තමන්ගේ පියාගේ රැකියාවේ විස්තරයක් සොයා ගැනීමයි.

රාත්‍රී කෑමෙන් පසු ඉදිරිපස පිලට වී බුලත් විටක් හපමින් සිටි තම පියා අසලට ගොස් ඔහුගේ ඔඩොක්කුවේ හිස තබා ගත්තේය. ඉන්පසු අද සිදු වූ සියලු කතන්දරය ඔහු පියාට ඉදිරිපත් කළේය. එසේ කියන විට සදෙව්ගේ පියා කිසිවක් ප්‍රකාශ නොකර ඔහුගේ අත්වලින් සදෙව්ගේ හිස පිරිමැද්දේය. සදෙව් අහම්බෙන් මෙන් සිය පියාගේ දෑත ගෙන අත ගා බැලුවේය. එය කොරොස් කට්ටක් මෙන් ගොරෝසුය. තැන තැන දිය පට්ට පැමිණ ගල් ගැසී ඇත. ඇතැම් තැන්වල තුවාල කැළැල්ය. අවුරුදු 23ක් තිස්සේ සිය පියා සමඟ සමීප දිවියක් ගත කර තිබුණත් ඔහුගේ දෑසට හසු නොවූ තම පියාගේ දෑත දැකීමෙන් සදෙව්ගේ හිතට විශාල දුකක් ඇති විය. ඔහු එම දෑත සිඹිමින් හැඩුවේය. තම පියා තමාට අධ්‍යාපනය ලබා දීම වෙනුවෙන් කරන ලද අනුපමේය කැපකිරීම් එකින් එකට සිහි කළේය. ජීවිතයේ ප්‍රථම වතාවට කවදාවත් ඇති නොවුණු කලකිරීමක්, දුකක් තමන් පිළිබඳව ඇති විය. අනෙක් අතට ඉවසාගත නොහැකි වේදනාවක් හා අනුකම්පාවක් සිය පියා වෙනුවෙන් ඇතිවිය.

පහුවදා පාන්දරම අවදි වූ ඔහු උදේ ආහාරය පිස, සිය පියා සේවය කළ ගල්වලට ගොස් ගල් කැඩීමට පටන් ගත්තේය. එහි පවතින කර්කශ බව විඩාව මෙන්ම කටුක බව වැටහීමට වැඩිවේලාවක් ගත නොවුණි. ඉතා ඉක්මනින් දෑත් පුරා දියපට්ටා පැමිණ අත තුවාල විය. පැය 2ක් පමණ ගල් කැඩීමෙන් තමන් වෙහෙසට පත්විය. නැවත කුළු ගෙඩිය ඇල්ලීමට නොහැකි තත්වයට අතපුරා දියපට්ටා දමා ඇත. අවුරුදු 25කට අධික කාලයක් සිය පියා මෙම රාජකාරිය කළේ කෙසේදැයි දැන් ඔහුට වැටහිණි. ඔහු තම නිවසට ඇවිත් නැවත හැඳ පැලඳගෙන කොළඹ බලා පිටත් විය. තමන් වෙනුවෙන් තම පියා කරන ලද කැප කිරීම් වටහා ගැනීමට තමන් මෙතරම් පමා වූයේ මන්දැයි දිගින් දිගටම කල්පනා කළේය.

ඔහු තමන්ටත් තමන් ලැබූ අධ්‍යාපනයටත් තමන්ගේ ජීවන පැවතුම්වලටත් ශාප කළේය. තමන් ගැනම ඇති වූ දැඩි කලකිරීමත් සමඟ චංචලාගේ නිවසට ගියේ තමන් දුවන්නේ මිරිඟුවක් පිටිපස්සේ බව වැටහුණු බව චංචලාට හා ගුණතිලක මහතාට ප්‍රකාශ කිරීමටය. කියපු වෙලාවටම සදෙව් චංචලාගේ නිවසට ගොඩ වූ අතර ඔවුන් දෙදෙනාම එහි සිටියෝය.

එන්න

'වාඩිවෙන්න සදෙව්'

ඒ ගුණතිලක මහතාගේ හඬයි. සදෙව් වාඩි විය. ඔහුට කොතනින් පටන් ගතයුතුදැයි වැටහීමක් නැත. ගුණතික මහතා කතාව ආරම්භ කරන ලකුණක් ද නැත. සදෙව් හිමින් සීරුවේ චංචලා දෙස බැලුවේය. ඇයද

නිහඬය. ගුණතිලක මහතා තමන්ගේ පාඩුවේ පත්තරය බලමින් සිටී. චංචලා ගොළුවත රකී. දෙදෙනාම කතාකරන පාටක් නැත. මෙලෙස විනාඩි 30ක් පමණ සදෙව්ට බලා සිටින්නට සිදු වූයේය. ගුණතිලක මහතා කතාව ආරම්භ කළේ ද නැත. අවසානයේ සදෙව්ම කතාව ආරම්භ කළේය.

"මට දුන්න රාජකාරි දෙකම කරන්න බැරිවුණා අංකල්"

"ඒ ඇයි"

"මට ඊයේ දවසට වෙනත් දෙයක් තේරුම් ගන්ඩ කාලය ගතවුණා"

"ඒ මොකක්ද?"

"මගේ තාත්තා මං වෙනුවෙන් කොච්චර කැප කිරීම් කරලා තියෙනවද? කියලා"

සදෙව්ට තවත් කතා කිරීමට නොහැකි විය.

ඔහුට ඇඬිණි. ඔහු මේ කරන්නේ තමන්ගේ අතපසු වූ විශාලතම යුතුකම පිළිබඳ පාපොච්චාරණයක් බැවින් එයට නැගෙන්නා වූ හැඬීම චංචලා හෝ ගුණතිලක මහතා ඉදිරියේ සැඟවීමට ඔහුට අවශ්‍ය නොවීය. ඔහු විනාඩි කිහිපයක් නිහඬව සිටියේය. ඔහුගේ දුක තුනී වන තුරු ගුණතිලක මහතාද කිසිවක් ප්‍රකාශ කළේ නැත.

"මගේ තාත්තාගේ අත්දෙක අල්ලපුවම මට තේරුණා එයා මං වෙනුවෙන් කරලා තියෙන කැපකිරීම. ඒ කැපකිරීම කරලා තියෙන්නේ

මං වෙනුවෙන්. මගේ අධ්‍යාපනය වෙනුවෙන් නේද කියලා හිතෙනකොට මට වාවගන්න බැරි වුණා අංකල්.

මං ගල්වලට ගිහින් ගල් කැඩුවා. ඒත් ඒ ගල් කඩන්න තරම් මගේ අත් හයිය නෑ අංකල්"

කියමින් සදෙව් දියපට්ටා දමා පුපුරා ඇති සිය දෑත් ගුණතිලක මහතාට පෙන්නුවේය.

"බොහොම අගෙයි පුතා. ඔයා මම කියපු දේ හොඳට තේරුම් අරන් තියෙනවා. මට අවශ්‍ය කළේ ඔයා දෙපයින් නැගිටින්නට ශක්තිය දෙන අදහස් තියෙන පුද්ගලයෙක් ද කියන එක දැනගන්න ගමන්, තම අතීතය අමතක කරන, යුතුකම් නොදන්න පුද්ගලයෙක්ද කියලා හොයලා බලන්න."

"ඒත් මට මගේ අනාගතය Plan කරගන්න බැරි වුණා අංකල්"

ඒ උනාට ඔයා ඔයාගේ අතීතය තේරුම් ගත්තා පුතා. මං ආඩම්බර වෙනවා ඔයා ගැන. මං ඔයාට උදව් කරන්නම්. දවසක ඔයා මං වගේම සාර්ථක මිනිහෙක් වෙයි.

ගුණතික මහතා කීවේ සදෙව්ව වැලඳගෙන ඔහුගේ පිටට තට්ටු කිරීමෙන්ය.

ඉන් අනතුරුව ගුණතිලක මහතා චංචලා දෙසද බලා,

"දවසක තාත්තාට එන්න කියන්න මාව හම්බ වෙන්න"

පවසමින් තරප්පු පෙළ නැග්ගේය.

සඳෙව්ට හා චංචලාට අදහා ගත නොහැක. වචන ගලාගෙන ආවේ නැත. හුස්ම වැටෙනා විදිහ මතක නැත. සිදු වූයේ දෙදෙනාම මුහුණින් මුහුණ බලාගෙන සිටීම පමණි.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★

# 04

## දළ රළ පෙළ

" බවතු සබ්බ මංගලම්, රඛ්ඛංතු සබ්බ දේවතා, සබ්බ සංඝානුභාවේන. සදා සොත්ථී භවන් තුතේ..."

" සාධු සාධු සාධු .....!!"

උදැසන බුද්ධ පූජා වතාවත්වල යෙදීමෙන් අනතුරුව බෝ මළුව දෙසට පිය මැන්නේ සිතට සැහැල්ලුවක් සොයමින්ය. නටුවෙන් ගිලිහී වැටෙන බෝ කොළයක් සුළඟේ පාවී ගොස් ඇතට වැටිණි. ගසට අඩුවක් දැනුණේත් නැත. කොළයට දුකක් වේදනාවක් දැනුණේත් නැත. නමුත් ගහෙන් කොළය වෙන් වී ඇත. මේ සංසාර ගමනද කවදා හෝ නිම

වනු ඇත. මේ පංසල, මේ ලොකු හාමුදුරුවෝ, මේ දායක සභාව හැරදා යාමට සිදු වේ. මේ දුක, දුකට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය, නමුත් එය අපට අවබෝධ කර ගැනීමට කොපමණ කාලයක් ගතවේද?

ලොව්තුරු බුදුරජාණන් වහන්සේගේ සමයේ උපත ලබා සිටියානම් අප මේ වන විට සසර ගමන නිමකර හමාරය. නමුත් පමා වැඩිය. ශරීරය පිනවමින් තව කොතරම් කාලයක් බලා ඉන්නද?

" පොඩි හාමුදුරුවනේ "

යස්සජීගේ හඬින් මම නැවත බෝ මළුව කරා ආවෙමි.

" පොඩි හාමුදුරුවනේ, ලොකු හාමුදුරුවෝ බලා ඉන්නවා."

"යමු යස්සජී"

යස්සජී පොඩි හාමුදුරුවන් සමඟ පියගැට පෙළ බැස ලැගුම් ගෙට ඇතුළු වුණේ දානේ ගැනීමටම නොවේ. උදේ ආහාරය ගැනීමට මට තවම බඩගින්නක් නැත.

" විථිකුලියේ නම "

"හාමුදුරුවනේ"

"වඩින්න දානේ ගන්න"

" එහෙයි හාමුදුරුවනේ"

දානේ ශාලාවට යන විට ලොකු හාමුදුරුවෝ දානේ බෙදාගෙන අවසන්ය. අනෙක් පොඩි දෙනම මා දානේ බෙදාගන්නාතුරු බලාගෙන සිටියෝය. උදේ දානේ වේල ගන්නට තරම් බඩගින්නක් නොදැනුණත් පොඩි දෙනම දෙස බලාගෙන කිරිබත් කැල්ලක් පිඟානට බෙදා ගතිමි.

"විථිකුලියේ නම"

"හාමුදුරුවනේ "

"හෙට මොකක්වත් වැඩක් එහෙම දාගෙන තියෙනවද?"

"නැහැ හාමුදුරුවනේ..... ඇයි ඔබ වහන්සේ එහෙම ඇහුවේ...."

"නෑ... මේ දායක සභාව හෙට සුනාමි සැමරුම්වලට උපකරණ බෙදා දීමට යන්ට දාගෙන තියෙනවා..."

"ලොකු හාමුදුරුවෝ වඩින එක නේද හොඳ?"

මගේ අකමැත්ත එකහෙළාම ලොකු හාමුදුරුවන්ට නොකියා මෙලෙස වචන ගළපා ගැනීමට හැකි වීම ගැන මම සතුටු වීමි.

"පෝද්දන්ගොඩ ලොකු හාමුදුරුවන්ට අංශභාගය හැදිලලු. මම උන්වහන්සේ බලලා එන්ට කියලා හිතාගෙන උන්නේ ... "

"අපි පොඩි දෙනමට වඩින්න කියමු හාමුදුරුවනේ ."

"නෑ වීථිකුලියේ නම වඩින්න. ආවටම තාම ගම් පළාතේ යන්ට බැරි වුණා නොවැ... "

"එහෙයි හාමුදුරුවනේ "

අවසානයේ තීන්දුව ලැබුණි. එල්ලුම් ගහ මං එනතුරු බලා සිටී. ඒ හෙට දවසේය. පිඟාන සෝදා රාක්කෙන් නමා දාන ශාලාවේ පිටුපස දොරෙන් නික්මුණේ කල්පනාකරන්නට බොහෝ දේ පැවති නිසාවෙනි. ගල්තලාව මතට නැගී ගල්වල අසල හිඳ ගත්තේ අඳනකඩේ ඔසවා කකුල් දෙක වතුරට ඔබා ගනිමින්ය. කකුලට දැනුණ සීතල මුළු සිරුර පුරා දුවවිත් අවසානයේ හදවත අසල ලැඟුම් ගත්තේය. එදා ගම හැරදා මෙතරම් පිටිසර පළාතකට ආවේ කවදාවත් ඒ ගමට ආපසු නොයන චේතනාවෙනි. ආපසු ඒ ගමට යෑමට තරම් බැඳීමක් දැන් ඉතිරි වී නැත. ඒ සියල්ලම මහ මුහුද රැගෙන ගියේය. බිරිඳ සාරා, පුතා සඳුන් මගේ දිවියේ ඉතිරිව සිටි එකම උරුමක්කාරයෝ වූහ. ඔවුන් දෙදෙනා පමණක් නොව හිටපු ගෙපැලද එදා මුහුද රැගෙන ගියේය.

ඒ අතීතය කෙතරම් කුරිරුද?

මීගමු වෙරළට ආසන්න කුඩා ගමක උපන් මා හට නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමට අවස්ථාවක් ලැබුණේ නැත. කුඩා කලදීම පියාගේ අකල් මරණය මමත් අම්මාත් තව තවත් අසරණ කරන්නට විය. වැල්ලෙන් ලබා ගන්නා මාළු මාව ඉක්මනින්ම ඉලන්දාරියෙක් කළේත් අම්මා වයස්ගත කළේත් එකම කාලයක් තුළදීය. ඒ අනුව අම්මාද මගේ තනියට සිටීමට තවත් කාලාන්තරයක් බලා සිටියේ නැත. ඇදුම රෝගයෙන් පෙළුණ ඇය මා හැර දමා ගියේ නැවත නොඑන්නටය. දුක, වේදනාව, තනිකම දරාගත නොහැකි විය. අවුරුදු 15ක් වියැති මම පැල්කොටේ තනි වීමි. මුලින්ම තාත්තත්, දැන් අම්මත් ජීවතුන් අතර

නැත. ඒත් මා ජීවත් විය යුතුය. කුඩා අවදියේ සිට මාළු විකිණීමෙන් ජීවත් වූ මට මාළු රස්සාව එපා වී තිබුණි. කෙසේ හෝ ජීවිතය ගැටගසා ගැනීමේ අදිටනින් කොළඹ බලා ගිය මට අවසානයේ කුඩා සිල්ලර බඩු කඩයක වැඩ කිරීමට අවස්ථාව ලැබුණි. උදේ 8 සිට එම කඩය විවෘත කරයි. නැවත වසා දමන්නේ රාත්‍රී 9.00ට ය. නිවාඩු නැත. ගබඩාවේ නිදා ගැනීමට ලැබේ. උදේ, දවල්, රාත්‍රී කෑම වේල ලැබේ. මේ සියල්ලම අවුරුදු 03 ක්ම මගේ තනිකම පාළුව මකා දැම්මේය.

ජීවිතය ගැන ලොකු බලාපොරොත්තුවක් තිබුණේ නැත. නමුත් එතනින් එහාට ජීවිතයට බලාපොරොත්තු එකතු විය. මට හිතන්නට අවශ්‍ය විය. සිහින දකින්නට අවශ්‍ය විය. ජීවිතය ගැන තීරණ ගන්නට අවශ්‍ය විය. මේ සියල්ලටම හේතු වූයේ එක් පුද්ගලයෙකි. ඒ කඩේ මුදලාලිගේ එකම දුව සාරාය. තවමත් පාසල් යන ඇ ඉගෙනීමට දක්ෂ ශිෂ්‍යාවක් විය. නමුත් ඇගේ උගත්කම, රූමත්කම මෙන්ම වත් පොහොසත්කම ද අපගේ ආදරයට බාධාවක් වුණේ නැත. මුලින් මාස ගණනාවක් හොර රහසේ ගෙවී ගිය ආදර කතාව මුදලාලිගේ කනට වැටී ඇත. එහි අවසන් ඵලය වූයේ මට රස්සාව අහිමි වීමයි. නමුත් සාරාගේ ආදරය මට අහිමි වූයේ නැත. සිය නිවසෙන් කෙරෙන අඩන්තේට්ටන් හමුවේ ඇය තව තවත් මගේ ආදරය පතමින් මා සොයමින් ජීවත් වූවාය.

මට රැකියාවක් නොමැත. හිඳින්නට තැනක් නොමැත. අවසානයේ තීන්දුව සාරාගෙන්ම ලැබුණි.

" අපි පැනලා යමු"

එය ප්‍රතික්ෂේප කිරීමට මට අවශ්‍යතාවයක් නොවීය. පාසැල් ගිය සාරා එම ඇඳුමෙන්ම මා සමඟ රහසේ පැන ආවාය. යන එන මං නොතිබූ මම නැවත ගමට ආවේ ජීවිතය අලුතින් පටන් ගැනීමේ තිර අදිටනින්ය. ඒ වෙනකොටත් ගරා වැටී තිබුණු අපේ නිවස, අත ඉතිරිව තිබුණු මුදලින් සකස් කරගෙන එදා සිට එම නිවසේ පදිංචි විය. මට දැන් තනියක් නැත. පාලුවක් නැත. ජීවත් වෙන්නට ආශාවන් ඇත. බලාපොරොත්තු ඇත. නැත්තේ රැකියාවක් පමණි. අප දෙදෙනාගේ අනාගතය වෙනුවෙන් මම නැවත පුරුදු රස්සාවට අඩිය තැබීමි. ඒත් ඒ මාළු විකිණීමට නොව මුහුදු ගොස් මාළු ඇල්ලීමටය.

වැල්ලේ කිහිප දෙනෙකු සමඟ එකතු වී කුඩා බෝට්ටුවකින් රාත්‍රියේදී මුහුදු යන මා නැවත වැල්ලට එනතුරු සාරා බලාගෙන සිටියාය. එම මාළු වැල්ලේදීම මාළුකාරයන්ට විකුණා ලබා ගන්නා මුදල අපගේ ජීවිත ගැටගසා ගැනීමට ප්‍රමාණවත් විය. මහා ලොකු බලාපොරොත්තු සාරා තුළද නොවීය. ඇයට අවශ්‍ය වූයේ ජීවිතය සතුටින් ගෙවීම පමණි. අප අතර කිසිදු ආරවුලක් ඇති නොවීය. ආදරය මුළු පැල් කොටේ පුරාම විහිදී ගියේය. ඒ නිසාමද කොහෙද අපගේ පැල් කොටේට අලුතින් සමාජිකයෙකු එකතු විය. මුලින් පැල් කොටේ පුරා විහිදුණේ සාරාගේ සුවඳය. නමුත් දැන් එය පරයා කිරි සුවඳින් පිනා යයි. ඒ සඳුන් පුතාය.

රාත්‍රියේ එළිවෙනතුරු මුහුදේ ලැග ගෙදර ආවත් කිසිදු මහන්සියක් නැත. පොඩි එකාගේ සුරතල් සිනාව නිසා ඒ විඩාව අමතක වෙලා යයි. මිල මුදල් මහ ලොකුවට නැති වුණත්, අපට එදාවේල අඩුවක් නැතිව පිරිමහ ගන්න අපට හැකි විය. නමුත් හැම දෙයක්ම තිබුණේ ඉතා කුඩා කාලසීමාවක් තුළය. ඒ සුනාමිය දක්වා පමණි.

මුහුදු ගිය මම අද ජීවත්ව සිටිමි. නුමුත් ගොඩබිම සිටි ඔවුන් අද මිය ගොස් ඇත...

ගත වූ සෑම තත්පරයක්ම ගෙවී ගියේ ඉතා සෙමිනි. වෙනදා මෙන් නොව අද දිනය ගත කිරීමට ඉතා අපහසුය. බෝ මළුවේ එහාට මෙහාට සක්මන් කළෙමි. බුදු කුටියට වී ඉඳගෙන සිටියෙමි. සයනයට වී පෙරළි පෙරළී සිටියෙමි. එහෙත් හිතට සැනසීමක් නැත. ගතට ද විඩාවක් දැනෙයි. නින්ද අසලවත් නැත. මුළු දෙසවන පුරාම හෝ හෝ හඬින් පිරී ඇත.

පසුවදා ගමනට දායක සභාවෙන් 20කට අධික පිරිසක් එක්ව සිටියෝය. ඔවුන් ඒ සඳහා වෑන් රථයක් සුදානම් කර තිබුණි. එහි ඉදිරි අසුනේ හිඳගෙන මම අවට පරිසරය දෙස බලමින් ගමනේ යෙදුණෙමි. පරක්තෙරක් නොපෙනෙන හැඟීමක් දැනීමක් නොමැති සිතුවිලි ජාලාවක් හිත පුරා හොල්මන් කළේය. මා පැහැදිලි දැක්මක් නොමැතිව අතීතය සොයා යන මෝඩයෙක් මෙන් වරක හැඟී ගියේය. තවත් වරක හිතන්නට දෙයක් නැති, කතා කරන්නට දෙයක් නැති බලාගත්තු අත බලාගෙන සිටින මානසික රෝගියෙක් මෙන් හැඟී ගියේය. මේ සියල්ලෙන්ම මට හැඟී ගියේ අතීතය අළු යට තිබුණු අඟුරු මෙන් මගේ හිත පෑරීමට ලක් කරන බවත් එම සිදුවීම දරුණු කම්පනයක් මසිත ඇති කර ඇති බවත් පමණි.

"හාමුදුරුවනේ .... ඔබ වහන්සේ වාහනයෙන් බහින්නේ නැද්ද... ?"

සිරිසේන උපාසක මහත්තයාගේ හඬත් සමඟ මම ඔහුට සිනා සී වාහනයේ දොර හැරියෙමි. පොළවට පය තබද්දී 33000ක් අධි බලැති

විදුලියක් මගේ සිරුරේ ගමන් ගන්නා වැනි හැඟීමක් දැනිණි. වාහනය නතර කර තිබුණේ අපේ ගමේ සමිති ශාලාව තිබූ පොල් රැප්පාවේය. ගරා වැටුණු සමිති ශාලාවට නුදුරින් අලුතින් ඉදිකරමින් යන නිවාස කිහිපයක් විය. අනෙක් පස ඉදිකර අවසන් වූ නිවාස කිහිපයක්ද විය. මෙතැන සිට අපේ ගෙදරට ඇත්තේ 100m කට අඩු දුරකි. දෙපා ඉබේටම ගමන් කළේ ඒ දෙසටය. ඒ පැල් කොටේ එතන නොවීය. ඊට 10m කට පමණ ඈතින් නව නිවෙසක් ඉදිවෙමින් තිබුණි. නමුත් මගේ අවධානය ඊට යොමු නොවිණි. වෙරළ දෙස බලා ඒ පැත්තට ගමන් කළෙමි. කුඩා ප්‍රමාණයේ ධීවර බෝට්ටු 04 ක් වැල්ලේ තිබුණි. මම ඒ අසලට ගොස් මුහුද දෙස බලාගෙන සිටියෙමි. මේ වැල්ලේ මගේ කොලු පැටියත් එක්ක කොච්චර සෙල්ලම් කර ඇත්ද? කොච්චර වැලි මාලිගා හදන්නට ඇත්ද? කොච්චර ලුණු කරේ විකුණන්නට ඇත්ද?

"පොඩි සාදුට පුලුවන්ද මාව බෝට්ටුවෙන් රවුමක් එක්කගෙන යන්න...."

කුඩා දරුවෙකුගේ හඬින් මම පසුපස හැරී බැලුවෙමි. ඇදහිය නොහැක. ඒ සඳුන් ද?

නෑ .... නෑ... සඳුන් ජීවතුන් අතර නෑ... ඒත් .....

මම දරුවා අසලට දුවගෙන ගියෙමි. අවුරුදු 04 ක් පමණ වයස ඇති මොහුට ඇත්තේ සඳුන් ගේ මුහුණයි. නෑ .. මේ ඔහුමයි.

සඳුන් පුතා...

මම ඔහුව වැලඳ ගත්තෙමි. හිතේ කොනක හිරවී තෙරපී පිපිරීමට බලා උන් හැඟිම් පොදියක් ළය පළාවිත් ගලා යන්නා සේ හැඟීමක් දැනී ගියේය. මට මගේ ලේ හඳුනන්නට පුළුවන් විය. නමුත් මගේ ලේ මා හඳුනා නොගත්තේය.

"අම්මේ ... අම්මේ ... "

දරුවාගේ කෑ ගැසීම ඇසී ඉදිකරමින් තිබූ නිවස තුළ සිට කාන්තාවක් දිව ආවාය. ඇය ගැබිනි මාතාවක් වූයෙන් දුව ආවේ ඉතාමත් අපහසුවෙන්ය.

දෑස් අදහාගත නොහැක මේ සාරාය. මම දරුවා අතහැර සාරා වෙත දිව ගියෙමි. ඇය මා හඳුනාගත්තාදැයි නොදනිමි. මම දුවගෙන ගොස් ඇය තරයේ වැලඳ ගත්තෙමි. මගේ වැලඳගැනීම ඇය ප්‍රතික්ෂේප නොකළෙන් ඇය මා හඳුනාගත් බව වැටහුණා පමණක් නොව ඇගේ වැළපෙන හඬට මගේ වේදනාත්මක හඬත් එක් විය.

වරදකි.

මා මේ කරන්නේ වරදකි.

මා දැන් සාරාගේ සැමියාවත් සඳුන්ගේ පියාවත් නොවේ. මම බුද්ධ පුත්‍රයෙක්මි.

ඇගේ උණුසුමින් මිදුණු මම ඇයට පිටුපා ආපසු හැරුණෙමි. මා දෙස බලාගෙන සිටි හැඩි දැඩි තරුණයෙක් මා හැරෙනවාත් සමඟ නිවස දෙසට පිය මැන්නේය. මම හෙමින් සීරුවේ මුහුද දෙසට පිය

මැන්නෙමි. සඳුන් පුතා බදාගෙන හඬන සාරා ගේ හඬ මට යාන්තමට ඇසුණි.

ඉර අවරට හැරී තිබුණි. නමුත් මොකක්දෝ මූසල බවක් මුළු අහස පුරාම පැතිර තිබුණි. මා එන තුරු බලා සිටි සාරා වෙනත් විවාහයක් කර ගන්නට ඇත. එය වැරැද්දක් නොව. මට වාවගත නොහැක්කේ එය එසේනම් නැවත අපව මුණ ගැස්සුවේ ඇයි යන කාරණාවය.

මම තවත් මේ සිවුර දරා සිටිය යුතුද?....

පරක්තෙරක් නොමැති මුහුදු දෙස බලා සිටින ගන්ධබ්බයෙක් මෙන් පාර දෙසට පිය මැන්නෙමි.

වාහනය මා එනතුරු බලා සිටියි. සඳුන් සාරා හා ඇගේ සැමියා ද බලාගෙන සිටියෝය. මම ඔවුන් අසලට ගොස් සඳුන්ගේ අත අල්ලා ගත්තෙමි. සාරා දෙසත් ඔහුගේ සැමියා දෙසත් බැලුවෙමි. පසුව පුතාත් රැගෙන වාහනය වෙත පිය මැන්නෙමි. වාහනයේ ඉදිරි දොර හැර අසුනේ වාඩි වී පුතාවද වාඩි කරවාගෙන දොර වසා දැමුවෙමි. වාහනය ගමන් ඇරඹුවේය.

වෙරළෙන් මෑතට යද්දී සාරා උන් පෙදෙස කෙරේ දෑස ගමන් කළේ ඉබේටමය. ඇය හඬන බව යාන්තමට හඳුනා ගත්තෙමි. එය නොපෙනෙන්නට යැයි සිතා දෑස වසාගත් විට මගේ දෙකම්මුලට කඳුළු බිඳු දෙකක් ගලාගෙන ගියේය. රියදුරු මහතා දකිතැයි සිතා සිවුරෙන් ඒ කඳුළු පිසදා හැරියෙමි...

අසල වුණු පුතා දෙස බලන විට ඔහු මා දෙස බලාගෙන ඉන්න අයුරු දුටුයෙන් ඔහුගේ කරවට අත යවා තුරුලු කරගෙන හිස සිම්ඹේමි. ඔහුද කිසිවක් නොපවසා මා දෙසට තව තවත් තුරුළු වන්නට විය.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★

# 5

# සයුරක් සසලයි

"බ්‍රව්නි..... බ්‍රව්නි..... ඔහොම ඉන්නවා බ්‍රව්නි....."

තරුණියගේ අතින් මුදාගත් දංවැල ඇදගෙන ආ අල්ශේෂන් බල්ලා නතර වූයේ ආකාශ්ගේ බත් කෙන්ද හැපීමෙන් අනතුරුවය. ප්‍රෙජරෝ රථයේ දෙර ඇරගෙන එක් කකුලක් එළියෙන් තබාගෙන දුරකථන ඇමතුමක් හා සම්බන්ධ වෙමින් සිටි ආකාශ්ගේ අතින් ජංගම දුරථනය ගිලිහිණි. සද්දන්ත බල්ලාගේ දත් පහරට හසු වූ තම කකුල අල්ලාගෙන වාහනයේ අනෙක් පසට බර වූ ආකාශ් සිදු වූ සිදුවීම ගැළපීමට උත්සාහ ගත්තේය.

"සොරි මිස්ටර්...."

ආකාශ් වටපිට බැලුවේ තමාට ඇසුණු ගැහැනු හඬේ දිශාව සොයා ගැනීමටය.

තවමත් ගොරවමින් සිටින බල්ලාගේ බෙල්ලේ ඇති පටියෙන් අල්ලාගෙන සිටින තරුණිය බල්ලා මෙල්ල කිරීමට උත්සහ කළාය.

"හැපුවයින් පස්සේ සොරි කියලා හරියනවායැ....."

සැබවින්ම ආකාශ් එසේ පැවසුවේ ඇයව කේන්ති ගැස්වීමටවත් තමාගේ කකුලේ පවතින වේදනාව ප්‍රකාශ කිරීමටවත් නොව සිදු වූ දේ හරිහැටි වටහා ගැනීමටය.

"හරියට මං හැපුවා වගේනේ කතා කරන්නේ ....."

"ඔයා හැපුවම මොකෝ ඔයාගේ බල්ලා හැපුවම මොකෝ "

තරුණියට ඇති වූයේ තදබල කේන්තියකි. තවමත් ගොරවමින් සිටින බල්ලා ඇදගෙන ගියේ පොළවත් සමග තරහෙන් මෙනි.

"මේ.... සොරි මිස් මම හිතලා නෙමෙයි කිව්වේ"

තරුණිය ඔහු දෙස බැලුවේවත් නැත. ආකාශ් ස්වල්ප වෙලාවක් ඇය දෙස බලා සිට ප්‍රෙජරෝ රථයට නැගී ඉගිල ගියේය.

මෙම සිදුවීම ආකාශ්ට ප්‍රබල ලෙස බලපෑවේය. ඔහු නැවත නැවත එම සිදුවීම මතක් කරමින් මහත් වින්දනයක් ලැබුවේය. විශ්වවිද්‍යාලයේදී කෙතරම් තරුණියන් දැක තිබුණත් ඇයගේ තිබූ ප්‍රියංකර බව ආකාශ්

වෙන කොතනකදීවත් හඳුනාගෙන තිබුණේ නැත. එදා රාත්‍රියේ ආකාශ්ට නින්ද ගියේ නැත. නින්ද යාගෙන එන හැම මොහොතකම ඇය හොල්මන් කරන්නට විය. පසුවදා අවදි වූයේ නැවත වරක් ඇය මුණ ගැසීමේ බලාපොරොත්තු ඇතිවය.

පෙරදින පැමිණි වෙලාවට කලින් රෝහලේ සිට පැමිණි ආකාශ්, ගාලු පාරට වැටෙන අතුරු පාරේ ටික දුරක් ගොස් රථය නතර කරගෙන සිටියේය. නමුත් ඔහු බලාපොරොත්තු වූ වෙලාවට ඇය පැමිණියේ නැත. ආකාශ් සුක්කානමට හිස තබාගෙන අඩ හෝරාවක් පමණ ගත කළේය. හිස ඔසවා බලන විට සද්දත්ත බල්ලා රැගෙන එන තරුණිය දැකගන්නට ලැබුණි. ඇය රථය අසලට පැමිණෙනවාත් සමගම ආකාශ් දෙර ඇරගෙන රථයෙන් බැස්සේය. නමුත් සද්දන්ත බල්ලා හඬනඟා බුරමින් ආකාශ් වෙත පැන්නේය. හොඳටම බිය වූ ආකාශ් රථයට නැග දෙර වසා ගත්තේය. තරුණිය බල්ලාව මෙල්ල කර ගත්තේ කට කොනට සිනාවක් නගමිනි. ආකාශ්ට තමා ලක් වූ අපහසුතාවයට ලැජ්ජාවක් හටගත්තත් ඇගේ සිනහවේ පැවති ප්‍රියංකර බවෙන් එය ක්ෂය වී ගියේය.

ආකාශ් තම නිවසට පැමිණියේ සුන් වූ බලාපොරොත්තු ඇතිවය. නමුත් ඇය මුණගැසී කතා කිරීමේ ආශාවක් ඔහු තුළ දළුලමින් පැවතියේය. පසුදා රෝහලේ සිට පැමිණියේ කෙසේ හෝ බල්ලා මෙල්ල කර ගැනීමේ දැඩි අධිෂ්ඨානයකිනි. රෝහලේ සිට එන විට ෆාමසියෙන් බිස්කට් පැකට්ටුවක් මිලදී ගැනීමට අමතක කළේ නැත. වාහනය නතර

කරනවාත් සමගම ඇය ඈතින් එනු දැක ආකාශ් අහස් මාලිගා තනන්නට විය. ඇය ඈතදී දුටු විටම ඔහු වාහනයෙන් බැස බිස්කට් පැකට්ටුව කඩා එයින් එකක් එළියට ගත්තේය. තමා වෙත ගොරවමින් පැමිණෙන බල්ලා වෙත එය දික් කළද , මුලදී එය පිළිගැනීමට බල්ලා උත්සහ කළේ නැත.

"බල්ලට නම් බෙහෙත් විදලා තියෙන්නේ, කාපු කෙනාට විද්දද දන්නේ නෑ නේද?"

බ්‍රවිනිගේ දංවැල තදින් අල්ලාගත් ඇය පැවසුවාය.

"it's ok මම doctor කෙනෙක්..... ඔයාගේ බල්ලා හරි සැරයිනේ?"

තරුණිය කිසිවක් පැවසූවේ නැත. බිම බලාගත්තා පමණි.

"මේ මම අහන්නමයි හිටියේ, කොහෙද මේ බල්ලා ඒකට ඉඩ දුන්නයැ....."

තවමත් තමා දෙස බල බලා ගොරවමින් බිස්කට් කන බල්ලා දෙස බලමින් ආකාශ් පැවසුවේය.

"මොකද්ද?"

"නම..."

"බ්‍රවිනි"

“බ්‍ර..විනි..”

“ඔව් බ්‍රවිනි

හරි අමුතු නමක්නේ ඔයාට තියෙන්නේ”

ඇයට සිනහව මැඩ ගැනීමට සුළු වෙලාවක් ගත විය.

“මගේ නම නෙමෙයි... ඒක මේ බල්ලගේ නම..මගේ නම රශ්මි, රශ්මි සංසලා...”

“රශ්මි සංසලා.....හරි ලස්සන නමක්...”

“thank’s”

“මම ආකාශ්, හඳුනා ගැනීම සතුටක්”

ආකාශ් පැවසුවේ අත දික් කරමින්ය. නමුත් බල්ලා ආකාශ් වෙත සමීප වෙයි යන බිය නිසා ඇය අතට අත දුන්නේ නැත. ආකාශ් සෑම දිනම රෝහලේ සිට පැමිණෙන විට රශ්මි මුණ ගැසීමට ගියේය. ඇය නිවසේ සිට ගාලු පාර දක්වා තම බල්ලා සමඟ ඇවිදීමට සෑම සන්ධ්‍යාවක්ම වෙන් කර ඇත. නිවසේ සිට ගාලු පාර දක්වා කිලෝමීටර් 1 ක් පමණ පවතින අතර එම දුර ප්‍රමාණය තුළ ආකාශ් සමග කතා කළාය. මුලදී ගොරවමින් බුර බුරා තමාව බිය ගැන්වූ බ්‍රවිනි ආකාශ්ගේ කුළුපග මිතුරෙකු වීමට වැඩි කලක් ගත වූයේ නැත.

කාලයත් සමග ආකාශ් හා රශ්මි නොදැක සිටීමට බැරී මට්ටමට සමීප මිතුරන් බවට පත් විය. ඒත් සමඟම ඔවුන්ගේ හිත් තුළ එකිනෙකා කෙරෙහි ආලයක් දළු ලා මෝරන්නට විය. නමුත් කිසිදු අවස්ථාවක ඒ බව ප්‍රකාශ කිරීමට උත්සහ කළේ නැත. ආකාශ්ට තම දෙමාපියන් විසින් ඕස්ට්‍රේලියාවේ ඉගෙනුම ලබන රොක්ෂි සමග විවාහ වන ලෙස යෝජනා කිරනු ලැබීමත් සමඟ තව තවත් ආකාශ් රශ්මිට සමීප වීමට උත්සහ ගත්තේය. එහි අවසාන ප්‍රතිඵලය වූයේ ආකාශ් තම අදහස රශ්මිට ප්‍රකාශ කිරීමයි.

"රශ්මි මම ඔයාට ආදරෙයි..."

නමුත් රශ්මි පිළිතුරු දුන්නේ වෙනස්ම ආකාරයෙනි.

කඳුළු පිරි දෙනෙතින් ආකාශ් දෙස බලා සිට දිව යෑම පමණි.

ඉන්පසු ආකාශ් හමුවීමට ඇය කිසි දිනක පැමිණියේ නැත. ආකාශ් තම කුළුඳුල් ආදරය වෙනුවෙන් සුපුරුදු මාවතේ රැකවල් දමා සිටියේය. තම ආදරය උපන් ගෙයිම මරා දැමීමට සිදුවීම වෙනුවෙන් දැඩි වේදනාවෙන් තැවුණු ආකාශ් මත්පැන් බෝතලයක් රැගෙන මුහුදු වෙරළට පිය මැන්නේය. ගලක් මත වාඩි වී මත්පැන් බෝතලයෙන් අඩක් පමණ පානය කළ ඔහුට සුපුරුදු රුවක් ඇතින් දැක ගැනීමට හැකි විය. බමන ගතින් කැරකෙන ආකාශ් වැනි වැනී ඇය කරා පියමනින්ට විය.

මේ ඇයයි. තමා පණ මෙන් ආදරය කරන තරුණියයි,

ආකාශ්ට දෙනෙත් අදහා ගැනීමට නොහැකි විය. ඔහුගේ දෙනෙතින් කඳුළු බිඳු දෙකක් බිම වැටෙන්නට පොරකමින් බලා සිටියේය.

"රශ්මි.....රශ්මි....."

තමාවෙත දුව එන තරුණයාට පෙර ඇය හඳුනා ගත්තේ ඔහුගේ අතේ පැවති මත්පැන් බෝතලයයි. ආකාශ්ගේ නිර්මල දෑස් යුගලය දුටු රශ්මි හඬා වැටෙන්නට විය. ඇය හඬන දෙස බලා සිටිනවා විනා ආකාශ්ගේ මුවින් එකදු වචනයක් පිටවූයේ නැත.

රශ්මි ලේන්සුව ගෙන මුව පිහදා ගත්තාය. ඇය ක්ෂිතිජය දෙස බලාගෙන ලේන්සුව පොඩි කළාය.

"ආදරයයි කැස්සයි හංගන්න බෑ රශ්මි... ඔයාගේ කටින් නොකීවට ඔයාගේ ඇස් දෙක මට හැමදේම කියනවා...."

රශ්මි ඔහුගේ මූණ දෙස බැලුවාය. අහිංසක මුහුණේ ඔහුගේ ආදරය ඇය හඳුනා ගත්තාය. ඒ වන විටත් ඇගේ දෑසින් කඳුළු බිඳු වැගිරෙන්නට වන.

"මාව තේරුම් ගන්න ආකාශ්..... ඔයා දකින තරම් මේ ලෝකය සුන්දර නෑ ආකාශ් .."

ඇය අහස දෙස බලා,

"මේ අහසයි පොළොවයි කවදාවත් එකතු කරන්න බෑ ආකාශ්"

"ඒ තරමටම මොකද්ද අපේ තියෙන දුරස්ථ බව..... නොගැළපීම....."

"නොගැළපීම මේ සමාජයෙන් ලැබිච්ච දෙයක්, ඔයා වැදගත් පවුලක කෙනෙක් ...."

ඇයට කියා ගැනීමට නොහැකි විය. නමුත් මේ සඳහා නැවත අවස්ථාවක් නොඑන බව මතක් වී ඇය හැඬුම නවතා ගත්තාය.

"මම කාත් කවුරුවත් නැති අසරණ කෙල්ලෙක් ආකාශ්...නිකම්ම.... නිකම්..... මාත් එක්ක හැමදාම එන බ්‍රවිනි ඉන්න ගෙදර වැඩකාර කෙල්ල ආකාශ්.....ඒකයි අපේ නොගැළපීම...."

ආකාශ්ගේ අතේ තිබුණු බෝතලය බිම වැටුණේ නිතැතිණි. මොහොතක්වත් බලා සිටීමට රශ්මීට වුවමනාවක් නොවීය. ඇය ඈතට දිව ගියාය. ආකාශ් ඇය නොපෙනී යන තුරු ඈ දෙස බලා සිටියේය.

ආකාශ් දින ගණනක් කල්පනා කළේය. අගක් මුලක් නොපෙනෙණ නූල් පන්දුවක් නැවත යථා තත්වයට පත් කිරීමට උත්සාහ කළේය. මෙලෙස ඔහු ලබන මානසික පීඩාව ඔහුගේ පෞද්ගලික ජීවිතයට පමණක් නොව වෘත්තියටද බලපාන්නට විය. රෝගීන් පරීක්ෂා කරන විට සියලු දේවල් අමතක කිරීමට උත්සාහ කළත්, ඇගේ මතකයන් ඔහුව විඩාවට පත් කළේය. බාහිර රෝගී අංශයේ කිසිදු අවධානයක් නොවූ හැන්දෑවක,

"නම"

"රශ්මි"

"ර... ශ්..... මි....".

ආකාශ් හිස ඔසවා බැලුවේය. ඒ ඇයයි, තමන් පණ මෙන් ආදරය කළ ඇයයි, ආකාශ්ට දරාගත නොහැකි සතුටක් ඇත සිට දිව ආවේය. ඔහු සිටින්නේ කොහිදැයි අමතක විය.

"කියන්න රශ්මි.... ඇයි.....ඇයි.... ඔයා මාව මග හරින්නේ...."

රශ්මි තම දෑස්වලින් වැගිරෙන කඳුළු පිසදා ගැනීමට උත්සහ නොකළාය.

"මට ඔයාගේ අතීතය ගැටලුවක් නොවෙයි රශ්මි..... මට වැදගත් වර්තමානය.....මට ඕන ඔයාට ආදරය කරන්න විතරයි...ඒකට ඔයාගේ දුප්පත්කම බාධාවක් නෙවෙයි....."

මුහුණ වසාගෙන සිටි ලේන්සුව පහතට ගත් රශ්මි ඔහු දෙස බලා සිටියාය. වචනයකුදු ප්‍රකාශ නොකළ රශ්මි ආකාශ්ගේ අත අල්ලා ගත්තාය. ඇගේ අතට උඩින් ආකාශ් ඔහුගේ අනිත් අත ද තබා ගත්තේය.

"බල්ලා කාපු එකට බෙහෙත් විද්දද..?"

"මට කෑවේ බල්ලෙක් නෙවෙයි..... මනුස්ස දුවක්....."

දෙදෙනාම එකවර සිනහ වූහ.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★

# 06

## මධුසමය

ක්‍රිං..... ක්‍රිං.....  ක්‍රිං..... ක්‍රිං.....

විදුලි සීනුවේ හඬ ඇසුණද සිතිජයගේ අවධානය එයට යොමු වූයේ නැත. හේතුව නාන කාමරය දෙසින් වතුර වැටෙන හඬ නිසාමදැයි නිච්චියක් නැත. ඇඳ විට්ටමට කොට්ටය හේත්තු කොට එයට පිට දී පපුවේ ඇති රෝම කූප අතගාමින් සිතිජය සිහින ලෝකයේ කිමිදෙන්නට විය.

ක්‍රිං..... ක්‍රිං.....  ක්‍රිං..... ක්‍රිං.....

යළිත් සීනුවේ හඬ ඇසිණි. නමුත් වතුර ගලන හඬ නතර වී ඇත.

ක්‍රිං..... ක්‍රිං..... ක්‍රිං..... ක්‍රිං.....

නාන කාමරයේ දොර ඇරිණි. සුභා ඔළුව එළියට දමා දොර දෙසත් ඇඳ දෙසත් බැලුවාය. සිතිජය තවමත් නිසොල්මන්ය.

"සිතී..... සිතී....."

ඒ සුභාගේ සුරතල් හඬය. සුභා නැවත නාන කාමරයට වී නැවත දොර හැර එබී බැලුවේ සිතිජයට වතුර ස්වල්පයක් ඉසිමින්ය. සිතිජගේ දැහැන බිඳිණි. ඔහු නාන කාමරය දෙස බැලුවේය. සුභා එබී බලාගෙන උන්නාය. ඇගේ තෙත කොණ්ඩය දිගේ වතුර බිඳු කිහිපයක් ටයිල් පොළොව මතට වැටිණි.

"දොර..... දොර....."

සුභා කීවේ කාමරයේ දොර දෙසට ඇඟිල්ල දික් කරමිනි. සිතිජය දොර දෙස බැලුවේය. ඔහුට කාරණය කුමක්දැයි කියා වටහාගත නොහැක.

ක්‍රිං..... ක්‍රිං..... ක්‍රිං..... ක්‍රිං.....

නැවතත් සීනුව නාද විය. සිතිජයට සිහින් සිනහවක් නැඟිණ. ඔහු ඇඳෙන් නැගිට සරම නැවත ගැටගසා ගත්තේ දොර දෙසට යමින්ය. ඔහු දොර හැරීමට පෙර නැවත නාන කාමරය දෙස බැලුවේය. සුභා ඇසක් ගසා නාන කාමරයේ දොර වසා ගත්තාය. නැවත වතුර ගලා යන හඬ ඇසිණි. සිතිජය දොර ඇරියේය.

"Sorry සර් කරදර කළාට..... අපි මේ වෙලාවට දොඩම් බීම එකක් දෙනවා".

සුදු ඇඳගත් වේටර් දොර අසලට වී බීම වීදුරු දෙක සහිත බන්දේසිය සිතිජය දෙසට දිගුකරමින් පැවසීය.

Thank's'

'ආ.... මල්ලි... මට බියර් එකකුයි වීදුරුවකුයි ගෙනත් දෙන්න පුළුවන්ද?

'Ok සර්..'

වේටර් පිටවී යාමට තරප්පු පේළිය දෙසට ගමන් කර නැවත හැරුණේය. තවමත් සිතිජය වේටර් දෙස බලාගෙන උන්නේය.

"සර්... ඒ කෑම Room එකටම ගේන්නද? පල්ලෙහාට එනවද?....."

"අපි පල්ලෙහාට එන්නම්"

"Ok සර්.."

සිතිජය කාමරයට ඇතුළු වී දොර වසා දැමුවේය. තවමත් නාන කාමරයේ වතුර ගලා යන හඬ ඇසේ. ඔහු නාන කාමරය දෙස මොහොතක් බලා සිට බන්දේසිය මේසය මත තබා යළි ඇඳ මත හාන්සි වී දැස පියා ගත්තේය.

"ඔයාගේ නම මොකක්ද"

"උප්පැන්නේ නම් ලියවිලා තියෙන්නේ නිලෝචනා ගමගේ කියලා.... හැබැයි ගමේ, නගරයේ, හැමකෙනෙක්ම කතා කරන්නේ නිලෝ කියලා. ඔයත් මට නිලෝ කියලා කිව්වම හොඳටම ඇති"

බැගය මේසය මත තබමින් නිලෝචනා ඇඳමත උඩුබැලි අතට වැතිරුණාය. ඇගේ උස් වූ ළමැද තාලයට උස් පහත් විය. ඇඟට හිරවෙන ලෙස ඇඳ සිටි ටී ෂර්ට් එක එසවී ඇගේ නාභිය පෙනිණි. කලව, තදවන ලෙස ඇඳ සිටි ඩෙනිම් කලිසමේ බෙල්ට් එකට උඩින් ඇගේ යට කලිසමේ කොටසක් පෙනිණි. පිළිවෙළින් උස් වූ ළමැද නිරාවරණය වූ නාභිය මෙන්ම යට කලිසම ද සිතිජයගේ අවධානය තරයේ රඳවා ගැනීමට සමත් නොවීය. ඔහු සුසුමක් හෙළා ජනේලය දෙස බලා කල්පනා කරන්නට විය.

"සිල් මුදන්ට කලින් වගේ ඇවිත් තියෙන්නේ....."

නිලෝචනා කීවේ උපහාසයෙන්ය. සිතිජය නිලෝචනා දෙස රවා බැලුවේය.

"මට Girl Friend කෙනෙක් ඉන්නවා"

"මට ඒක අදාළ නෑ.."

"මම ළඟදි Marry කරන්ඩ ඉන්නේ.."

"මම කාටවත් කියන්නේ නෑ..."

"මගේ වෙඩින් එකට තව මාස 5යි තියෙන්නේ "

"ඒක ප්‍රශ්නයක් කරගන්න එපා"

"ඒත් මට ලොකු ප්‍රශ්නයක් තියෙනවා"

"අපි ළඟට ගොඩක් එන්නේ ඔය වගේ ප්‍රශ්න තියෙන අය තමයි...."

"ඒ හැම එකකටම වඩා මේක වෙනස් ප්‍රශ්නයක්..."

"මට පරක්කු වෙනවා..."

"මම කිසිම කෙනෙක් එක්ක ලිංගික සම්බන්ධයක් පවත්වලා නෑ..."

"මෙච්චර කල් මහණ වෙලාද හිටියේ..."

"මට ලොකු බයක් දැනෙනවා..... මට ලිංගික අත්දැකීමක් නැති නිසා..."

"ඒකද හනිමුන් එකට කලින් මං ළඟට ආවේ"

සිතිජය වහා නැඟිට නිලෝචනා අසලට ආවේය. ඇගේ දෑතින් අල්ලා ගත්තේය. අමාරුවෙන් ගළපා, ගොතා, රැස් කරගත් වචන ටික මෙතරම් විගසින් කියා දැමීමට හැකි වීම ගැන ඔහුට ප්‍රීතියක් ඇති විය.

"මේ අහන්න නංගි... මං ගැන වැරදියට හිතන්න එපා.. මට ඔයාගේ උදව් ඕනේ.. අද දවස මට ලොකු අත්දැකීමක් වෙයි. එක අතකින් මේක වැරදියි. ඒත් මේක මට මහා හිසරදයක්..."

"ඔයා අවංක වැඩියි... ඒ වගේම හොඳත් වැඩියි. ඔහොම අය අපට හම්බවෙන්නේ හරිම අඩුවෙන්. බය වෙන්ඩ එපා ඔයාගේ බය හිමීට අඩුවෙලා යයි. නමුත් මට දුකයි ඔයාලා වගේ පිරිමිත් අද කාලේ ඉන්නවා නේද කියලා"

නිලෝචනා දැනින්ම සිතිජය බදා ගත්තාය. ඇගේ දෑත්වල ස්පර්ය සිතිජය උණුසුම් කිරීමට සමත් වුවත් ඔහුගේ වෙව්ලන දෑත් නිලෝචනාගේ ගත ස්පර්ශ කිරීමට බොහෝ කාලයක් ගත විය.

එක් පැයක් පමණක් නොව පැය 06ක කාලයක් දෙදෙනා වික්ටෝරියා ගෙස්ට්හි කාමරයට වී උණුසුම විඳගත්තෝය. නොදුටු නොවිඳපු අත්දැකීම් ගණනාවක් විඳදරා ගැනීමට සිතිජයට එදින හැකි විය. කාමරයේ යතුර හාර දී ගෙස්ට් හවුස් එකෙන් පිටවී යන අවස්ථාවේ නිලෝචනාට බෙහෙවින් ස්තුති කිරීමට සිතිජය අමතක කළේ නැත. අමතර රු. 1000 මුදලක් ද ඇයට දීමට ඔහු අමතක නොකළේය.

"හිතුව තරමට ඔයත් නරක නෑ..."

සිතිජය ලබා දුන් මුදල් ප්‍රතික්ෂේප නොකරමින් ඇගේ ගමන් මල්ලට ඔබා ගනිමින් නිලෝචනා පැවසුවේ පාරේ ගිය ත්‍රීරෝද රථයකට අත දිගු කරමින්ය.

ඇගේ වදනට සිතිජයට සිහින් සිනහවක් නැගිණි.

"මොකද තනියම හිනාවෙන්නේ..."

සුභා තෙත කොණ්ඩය පිසිමින් සිතිජය අසල හිඳගනිමින් ඇසුවාය. සිතිජයගේ කල්පනා ලෝකය අතුරුදහන් විය.

"නෑ නිකන්... අන්න බීම..."

සුභා ඇඳෙන් නැගිට ගොස් බීම දෙක අතට ගත්තාය. එකක් සිතිජයට දිගු කොට අනෙක තොල ගාමින් නැවත සිතිජ අසල හිඳ ගත්තාය.

"ඔයා හරි කල්පනාවක ඉන්නේ... අද වගේ දවසකත් "

"නෑ එහෙම එකක් නෑ... මුල් ඇඳුම දවසම ඇඳන් ඉදලා මට හරි මහන්සියි. ඒ නිසා වෙන්න ඇති....."

ක්‍රිං..... ක්‍රිං..... ක්‍රිං..... ක්‍රිං.....

"ඉන්න මං බලන්නම්..."

සුභා නැගිට දොර ඇරියාය.

"මිස් සර් ඕඩර් කළේ..."

වේටර් සිනහා වී සුභාට බන්දේසිය දිගු කළේය.

"Thanks"

සුභා බන්දේසිය රැගෙන දොර වසා දැම්මාය.

"දඩාං"

ඒ දොර වැසුණු හඬයි. සිතිජය දොර දෙසත් සුභා දෙසත් මාරුවෙන් මාරුවට බැලුවේය. නමුත් සුභා කිසිවක් ප්‍රකාශ කළේ නැත. බන්දේසිය මේසය මත තබා බැල්කනියට පිය මැන්නාය. සිතිජය තවමත් දොඩම් වීදුරුව අත මත තියාගෙන කල්පනා කරන්නට විය. මොහොතක් එලෙසම හිඳ ඇඳෙන් නැගිට දොඩම් වීදුරුව මේසය මත තබා මේසය මත වූ බියර් බෝතලය අතට ගත්තේය. මූඩිය ඉවත් කර එක දිගට වීදුරුවට බියර් වත් කළේය. පෙණවලින් පිරීගිය වීදුරුව උතුරා ගොස් මේසය මතද හැලිණ. පෙණ ටික වියැකී යන තුරු මද වේලාවක් බලා

සිටි සිතිජය හෙමින් හෙමින් වීදුරුව පුරවා ගන්නට විය. ඔහු බියර් වීදුරුව රැගෙන බැල්කනියට ගොස් නුවර අහස දෙස බලා කල්පනා කරන සුභාගේ කරට අත දමා ගත්තේය.

"මං දන්නෑනේ ඔයා බොනවා කියලා..."

සුභා අහස දෙස බලාගෙනම ඇසුවාය.

"ඒ කවදාවත් මම බීපු නැති නිසා..."

"මට බොරු කරන්න එපා සිතිජය... මට පේන විදියට ඔයා ලෝකයට මවලා පෙන්නුවේ හරිම සුදු චරිතයක්...."

"එහෙම දෙයක් නෑ සුභා ... මට අද ටිකක් බොන්න හිතුණා"

"හේතුව සතුටට ද?... දුකටද?"

සුභා ඇසුවේ සිතිජයගේ මූණ දෙස බලා ඔහුට තුරුල් වෙමින්ය.

"ඒ දෙකටම නෙවෙයි..."

සුභා නැවතත් සිතිජයගේ මුහුණ දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයක් මතු කරගනිමින්ය.

"එහෙනම්..."

"අනේ මන්දා..."

සුභා ගස්සාගෙන කාමරය වෙත පියමනින්නට විය. සිතිජය හිරු බැසයන අහස දෙස බල බලා බියර් තොල ගාන්නට විය. ඔහු මීට පෙර

බියර් තොල ගා නොතිබුණි. පළමු උගුර පහළට ගලා බසිද්දී කට කාරගෙන යන තිත්ත රසක් සිතිජයට දැනෙන්නට විය. පළමු උගුරෙන් පසුව එය නොබී ඉන්නට තැත් කළත් එම වීදුරුව එක හුස්මට ගිල දමන ලෙස ඔහුගේ මනස ඔහුට වද දෙන්නට විය. නහය වසා ගත් සිතිජය එක හුස්මට බියර් වීදුරුව හිස් කර දැමුවේය. කාමරය දෙස බැලූ විට ඔහු දුටුවේ මුනින් අතට වැතිර සිටින සුභාය. ඔහු නැවත කාමරය වෙත ගොස් සුභා දෙස මොහොතක් බලා සිටියේය. නමුත් ඇය සමඟ කතාවට ගියේ නැත. මේසය අසලට ගොස් ඉතිරි බියර් ටික වීදුරුවට හලාගෙන නැවත බැල්කනියට පිය මැන්නේය.

හිරු බැස ගොස් ඇත. කඳුයායම අඳුරින් වැසි ගොසින්ය. සිතිජයගේ සිතද ගතද ඔත්පල වී ඇති සෙයක් ඔහුට දැනෙන්නට විය.

ඇයි මං මේ කසාදයට කැමති වුණේ?

ඇයි මට මගේ පාඩුවේ ඉන්න ඉඩ නොලැබුණේ?

මං ඇයි එක රැයකට ගැහැනියක් පසුපස ගියේ?

තේරුම් ගත නොහැකි අගක් මුලක් නොමැති සිතිවිලි ජාලයකින් සිතිජයගේ සිත තව තවත් බර කළේය.

කුඩා කල සිටම පන්සල් ගොස් බණ භාවනා කර, ජීවත් වූ සිතිජයට පන්සල, නෙතට අමා දහරක් මෙන් විය. ඔහු නිශ්ශබ්දතාවයට ඇලුම් කළේය. බණ භාවනාවට ප්‍රිය කළේය. සිල් ගත්තේය. ඒ නිසාම මස් මාළු ආහාරයට නොගත්තේය. කිසිදු දිනක අරක්කු සිගරට් තොල නොගෑවේය.

නමුත්.....

මේ සියල්ල ඔහුගේ විවාහය හමුවේ වෙනස් කිරීමට සමත් විය. මුලදී විවාහ නොවීමට තීරණය කොටගෙන සිටි සිතිජයට මරණාසන්න වූ සිය මවගේ පෙරැත්ත පිට ඇයට වූ පොරොන්දුව පිට ඔහු සුභා සමඟ විවාහ වීමට තීරණය කළේය.

නමුත්.....

ඔහුගේ එම තීරණය ඔහුගේ චිත්ත සන්තානයේ ප්‍රබල අතීරණයක් ඇති කිරීමට පාරකපා දුන්නේය. පසෙකින් යහළු යෙහෙළියන්ගේ උසුළු විසුළු මැද ලිංගිකත්වයට බිය විය. අනාගතයට බිය විය. ඒ සියල්ලම පසෙක දා සිය මවගේ පොරොන්දුව ඉටු කිරීම වෙනුවෙන් අවසානයේ සුභා සමඟ විවාහ වුයේය. අද ඔහු මධුසමය වෙනුවෙන් පැමිණ ඇත.

බියර් වීදුරු දෙකට ඔහුගේ හිස කැරකෙන සෙයක් දැනුණු නිසා කාමරයට විත් ඇඳමත හිඳ ගත්තේය. සුභා තවමත් අනෙක් පසට හැරී මුනින් අතට දිගා වී උන්නාය.

කාමරය නිසොල්මන්ය. සිවිලිමේ එල්ලා තිබූ විදුලි පංකාව එක දිගට කැරකැවෙයි. එයින් නිකුත්වන සුළං ධාරාවෙන් සුභාගේ වරලසෙහි තෙත් බව තරමක් අඩු කර ඇත. කාමරයට පැමිණීමට පෙර සිය යහළුවන්ගේ උසුළු විසුළු මතක් විය. අනෙක් පසින් නිලෝචනා සමඟ ගත කළ රාත්‍රිය මතක් විය. තවත් අතකින් .....

ඩික්... ඩික්... ඩික්...

ඒ හඬට සුභා ඔළුව උස්සා සිතිජය දෙස බැලුවාය.

සුභා කෑ ගසමින් සිතිජය අල්ලා ගැනීමට ඇඳෙන් අනෙක් පසෙන් බැස දුව ආවාය.

"සිතිජය... මොකද මේ වෙලා තියෙන්නේ "

ඇද විට්ටමට ඔළුව ගසා ගනිමින් සිටින සිතිජය වාරු කර ගැනීමට සුභා ඔහුගේ පිටිපස්සෙන් ඉඳගෙන බදා ගත්තාය. සිතිජයගේ හිස පැලී ලේ ගලමින් තිබුණේය. ඇඳට එලා තිබුණු සුදු බෙඩ් ෂීට් එකට ලේ බිඳු කිහිපයක් වැටිණි.

"ඔයාට මොකද වෙලා තියෙන්නේ සිතිජය" සුභා අසල තිබූ තුවාය රැගෙන ඔහුගේ හිසෙන් ගලා බසින ලේ පිස දැමුවාය.

"මට සමාවෙන්න සුභා....."

"මට සමාවෙන්න"

සුභාට මහත් අනුකම්පාවක් ඇතිවිය. තමා මෙම විවාහයට කැමති වුණේ සිතිජයගේ මේ අහිංසක කමට නේදැයි ඇගේ දෙසවන් පුරා දෝංකාර දෙන්නට විය.

ඒත්..... ඒත්....

"සමාව දෙන්ඩ තරම් වැරැද්දක් නෙමෙයි මං කරලා තියෙන්නේ..... සමාව දෙන්ඩ බැරි විදියට මාව අසරණ කළා සුභා"

සිතිජයගේ දෑසින් කඳුළු ගලා ආවේය. ඔහු හඬන්නට විය.

"දෙයියනේ ඇයි මේ....."

සුභා සිතිජයගේ නිකටෙන් අල්ලා ඇස් දෙකෙන් ගලා යන කඳුළු පිස දැමුවාය.

"මට සමාවෙන්න සුභා....."

"ඇයි ඔයා එහෙම කියන්නේ..."

"මට තේරෙන්නේ නෑ මම මේක ඔයාට කොහොම කියන්ඩද කියලා"

"මං වැටුණු වලේ මට ඔයාව දාන්න බෑ සුභා"

"ඒ වගේම මට මැරෙන්ඩ වැටිලා ඉන්න මගේ අම්මගේ පොරොන්දුව අහක දාන්නත් බැරි වුණා"

"මට තේරෙන්නේ නෑ සිතිජය ඔයා මේ මොනවා කියන්ඩ හදනවද කියලා"

"ඒක තේරෙන්නේ නැති නිසාම තමයි මම මේ අඬන්නේ සුභා"

"මට මැරෙන්ඩ බෑ සුභා. මැරෙන්ඩ වැටිලා ඉන්න අම්මව තනි කරලා මට මැරෙන්ඩ බෑ. ඒ වගේම මට ඔයාව අමාරුවේ දාන්ඩත් බෑ සුභා"

"කරුණාකරලා ඔයා මේ ලියුම කියවන්න....

සිතිජය සිය බෑගයේ උඩ සාක්කුවේ තිබූ ලියුම් කවරයක් දිගු කළේය. වෙවුලන දැතින් ඇය එම ලියුම් කවරය දිග හැර එහි තිබූ කඩදාසි කැබැල්ල දිගහැර බැලුවාය.

සුභා.....

මට සමාවෙන්න.

ඔයා මේ දේ කෙසේ වටහා ගනිවිදැයි මා නොදනිමි. මෙහිදී මා 100% ක්ම වැරදී යැයි කිව නොහැක. ඒත් මා වැරදියි. කුඩා අවදියේ සිටම ගිහි ජීවිතයට මම ඇලුම් නොකළෙමි. නමුත් මම මහණ වුණේ නැත. ඒ මට මගේ අම්මා තනි කිරීමට නොහැකි නිසයි. මම සමාජයට බයයි. ලෝකයට බයයි. ඒ හැම වෙලාවේදීම ඔවුන් මාව කොන් කරපු නිසා, පිළිකුල් කරපු නිසා මම ඔවුන්ගෙන් වහන් වුණා. තනි වුණා. මට විවාහ වෙන්න ආශාවක් හෝ කැමැත්තක් හෝ කවදාවත් තිබුණේ නෑ. ඔත්පල වෙලා ඉන්න අම්මගේ පොරොන්දුව ඉටු කිරීමට මා මේ කසාදයට කැමති වුණා. ඒ කැමැත්ත මාව තව තවත් මුළු ගැන්වීමට හේතු වුණා. පවුල් ජීවිතයක් ගත කිරීමට තරම් පෞර්ෂත්වයක් මට තියෙනවාදැයි මා මගෙන්ම ප්‍රශ්න කළා. මා ලිංගිකව එක්වීමට බය වුණා. සමාජය මාව තව තවත් බය කළා.

සුභා ඔයාට හිතෙයි මම මානසික ලෙඩෙක්ය කියා. ඒක එක්තරා දුරකට හරි වෙන්නත් පුළුවන්. මම අවසානයේ තීරණයක් ගත්තා. ඒ තීරණයට මට මගේ හිතවත්ම යාළුවෙක් උදව් කළා. ඔහු මට හොඳ උපදේශකයෙක් මුණ ගැස්සුවා. ටිකෙන් ටික මම වෙනස් වුණා. අවසානයේ මේ වෙනස තේරුම් ගන්නට මට අවශ්‍ය වුණා. ඒ

යාළුවාගේ උදව්ව මට ඒ අවස්ථාවේදීත් ලැබුණා. මම වෙනත් ගෑනු ළමයෙක් සමඟ දැනට මාස 05කට පෙර මේ හෝටලයේ මේ කාමරයේම තනි වුණා. ඒ මගේ කුපාඩිකමට නෙමෙයි. මට මගේ බය ඇර ගැනීමට අවශ්‍ය වුණා. මාව වැරදියට තේරුම් ගන්න එපා. එදා මගේ බය, තුනීවෙලා තව තවත් ජීවත්වන්නට ඕනේ කියලා මට හැඟීමක් ඇති වුණා. ආශාවක් ඇති වුණා. ඒ ආශාව නිසාම මා ගොඩක් හීන මාලිගා හැදුවා. හැබැයි ඒ මාලිගා දිය වී යන්නට වැඩි කලක් ගත වුණේ නෑ. මොකද මා ඒවා හදලා තිබුණේ ඉටියෙන්.

ඊට මාස දෙකකට පමණ පසු අර මගේ යාළුවා මාව මුණ ගැසෙන්න ආවා. ඔහු කීවා මට වහාම ඔහුත් සමඟ හොස්පිටල්එකට යමුයි කියලා. තේරුම් ගන්ඩ බැරිවුණා ඒ ඇයි කියලා. ඔහු කීවා ඔහුට ලේ එකක් අවශ්‍ය වෙලා තියෙනවා කියලා. මම කොහොමත් දානයට කැමති නිසා එක පයින්ම ඉදිරිපත් වුණා. හැබැයි මම හොස්පිටල් ගියාමයි දන්නේ මම ඇවිත් තියෙන්නේ ලේ දන් දීමට නෙමෙයි ලේ එකක් චෙක් කිරීමට කියලා. අවසානයේ මට රිපෝර්ට් එකත් ලැබුණා. ඒ වගේම රිපෝර්ට් එකක් මගේ යාළුවාටත් ලැබිලා තිබුණා. මම ඒ රිපෝර්ට් එකෙන් පසුව ජීවත් වුණාට වැඩිය මැරුණා. ඒත් මා දැන් ජීවත් වන්නේ නෑ මොකද මම මේ වන විටත් මැරිලා නිසා.

සුභා ලිපිය පහත් කර කාමරය දෙස බැලුවාය. සිතිජය කාමරයේ සිටියේ නැත. ඇය ලිපිය විසිකර බැල්කනියට දිව ගියාය.

තට්ටු 3ක් උඩ බැල්කනියේ සිට පහළ අඩ අඳුරෙන් දැක ගැනීමට ලැබුණේ මුනින් අතට වැටී සිටින සිතිජයි.

"සිතිජ"

සුභා කෑ ගැසුවාය. ඇයට ක්ලාන්ත ගතියක් දැනෙන්න විය. ඇයට ලිපිය මතක් විය.

මට සමාවෙන්න සුභා මට මේක මේ ලෝකේ කාටවත් කියා ගන්න බැරිවුණා.

මගේ අම්මටවත්. දැන් මට තේරෙනවා මට පෞරුෂත්වයක් තිබුණේ නෑ කියලා ලෝකෙට මුණ දෙන්න. ඔයා මගේ ජීවිතෙන් ඈත් වෙන්න. මම ඔයාව විවාහ කර ගත්තේ මගේ අම්මගේ පොරොන්දුව ඉටු කරන්න. නමුත්, ඒ පොරොන්දුව උඩ මට ඔයාව මරන්න බෑ. මොකද? මේ වෙනකොට මම සමාජ රෝගියෙක්, මට සමාවෙන්න

මීට

සිතිජය.

සුභාගේ හිස බර ගතියක් දැනුණෙන් ඇය හේත්තු වීමට බැල්කනිය ඇල්ලීමට උත්සහ කළාය. හෙමිහිට බැල්කනියේ බිම ඉඳගත්තාය.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★